ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
இலங்கை சமூகப் பாதுகாப்புச் சபை
SRI LANKA SOCIAL SECURITY BOARD

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment

# වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන
# வருடாந்த அறிக்கை மற்றும் நிதிக் கூற்று
# ANNUAL REPORT AND FINANCIAL STATEMENTS

# 2024

''සමාජ ආරක්ෂණ පියස'', අංක : 18, රාජගිරිය පාර, රාජගිරිය.
දුරකථන : 0112 886585 / 0112 886586, ක්ෂණික ඇමතුම් : 0112 886088
වෙබ් අඩවිය : www.ssb.gov.lk ඊ - මේල් : info@ssb.gov.lk

# අන්තර්ගතය


| අනු අංකය | | | විස්තරය | පිටු අංකය |
|---|---|---|---|---|
| 01 | | | වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම | 01 |
| 02 | | | අපගේ තේමාව | 02 |
| 03 | | | අපගේ දැක්ම, මෙහෙවර සහ වටිනාකම් | 02 |
| | 03.01 | | දැක්ම | 02 |
| | 03.02 | | මෙහෙවර | 02 |
| | 03.03 | | අපගේ  වටිනාකම් | 02 |
| 04 | | | සභාපතිතුමාගේ පණිවිඩය | 03 |
| 05 | | | අධ්‍යක්ෂ මණ්ඩලය  2024 | 04 |
| 06 | | | විගණන කමිටු -2024 | 05 |
| 07 | | | සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචන | 06 |
| 08 | | | කළමනාකරණ කණ්ඩායම (2024.12.31 දිනට) | 08 |
| 09 | | | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය | 10 |
| 10 | | | අගය නිර්මාණය කිරීමේ මාදිලිය | 11 |
| 11 | | | “ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය” යනු කුමක්ද? | 13 |
| | 11.01 | | ව්‍යවස්ථාපිත අරමුණු | 13 |
| | 11.02 | | කාර්යභාරය | 13 |
| | 11.03 | | අපගේ සේවාවන් | 14 |
| | | 11.3.1. | ප්‍රධාන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම | 14 |
| | | 11.3.2. | විශේෂිත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම | 14 |
| | 11.4. | | යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ | 14 |
| | 11.5. | | “සුරකුම” විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | 15 |
| | | 11.5.1 | “සුරකුම” යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ | 15 |
| | 11.6. | | “ආරස්සාව” පූර්ව සැලසුම් යෝජනා ක්‍රම | 17 |
| | | 11.6.1 | “ආරස්සාව” පූර්ව සැලසුම් ක්‍රමයේ ප්‍රතිලාභ | 17 |
| 12 | | | තිරසාර සංවර්ධන ඉලක්ක | 18 |
| 13 | | | කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණ | 20 |
| | 13.1 | | 2024 වර්ෂයේ විශේෂ අවස්ථා සහ කළමනාකරණ විශ්ලේෂණය | 20 |
| | 13.2 | | මුළු බඳවා ගැනීම් එකතුව පදනම්ව ඉහළම ප්‍රගතිය වාර්තාකළ සම්බන්ධීකරණ නිලධාරීන් -  2024 | 24 |
| | 13.3. | | පළමු වාරික මුදල් රැස්කිරීම්හි එකතුව පදනම්ව ඉහළම ප්‍රගතිය වාර්තා කළ සම්බන්ධීකරණ නිලධාරීන් -2024 | 25 |
| | 13.4 | | අනුමත කාර්යය මණ්ඩලය හා පුරප්පාඩු | 26 |
| | 13.5. | | අනුමත කාර්යය මණ්ඩලය වැඩි කිරීම හා පුරප්පාඩු පිරවීම | 26 |
| | 13.6 | | 2024 වර්ෂයේ අස්වීම් හා විශ්‍රාම යාම් | 27 |
| | 13.7 | | පුහුණුව හා සංවර්ධනය | 28 |

| අනු අංකය | | | විස්තරය | පිටු අංකය |
|---|---|---|---|---|
| 14 | | | මණ්ඩලයේ කොට්ඨාශ/ අංශ / ඒකකවල කාර්යයන් | 30 |
| | 14.1. | | පාලන අංශය | 30 |
| | | 14.1.1 | පාලන අංශයේ ප්‍රධාන කාර්යයන් | 30 |
| | | 14.1.2 | පාලන අංශයේ සත්‍ය කාර්යය මණ්ඩලය | 31 |
| | | 14.1.3 | භෞතික සම්පත් | 31 |
| | | 14.1.4 | සන්නිවේදන පහසුකම් | 31 |
| | | 14.1.5 | ප්‍රවාහන පහසුකම් | 32 |
| | | 14.1.5.1 | දැනට තිබෙන වාහනවල විස්තර (2024.12.31 දිනට) | 32 |
| | | 14.1.6 | පාලන අංශයේ සීමාවන් | 33 |
| | 14.2 | | සමාජ ආරක්ෂණ අංශය | 34 |
| | | 14.2.1 | ප්‍රධාන කාර්යයන් | 34 |
| | | 14.2.2 | ප්‍රතිලාභ ගෙවීම | 34 |
| | | 14.2.3 | සේවා ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාල | 34 |
| | | 14.2.4 | යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධ වන නිලධාරින් | 34 |
| | | 14.2.5 | සමාජ ආරක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය | 35 |
| | | 14.2.6 | සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය | 36 |
| | | 14.2.7 | නව සාමාජිකයින් බඳවාගැනීමේ හා වාරික රැස්කිරීමේ වාර්ෂික ප්‍රගතිය | 37 |
| | | 14.2.8 | 2024 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම | 38 |
| | | 14.2.9 | 2024 වර්ෂයේ දායකයින්ගේ අය කළ මුදල් | 38 |
| | | 14.2.10 | 2024 වර්ෂයේ පවත්වන ලද පුහුණු හා ජංගම දැනුවත් කිරිමේ වැඩසටහන | 38 |
| | | 14.2.11 | සමාජ ආරක්ෂණ අංශයේ සීමාවන් | 38 |
| | 14.3 | | මුදල් අංශය | 39 |
| | | 14.3.1 | ප්‍රධාන කාර්යයන් | 39 |
| | | 14.3.2 | මුදල් අංශයේ සත්‍ය කාර්යය මණ්ඩලය | 39 |
| | | 14.3.3 | ආයතනය සතු වත්කම් | 40 |
| | | 14.3.4 | 2024 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන | 40 |
| | | 14.3.5 | වෙනත් ළගා කර ගැනීම් | 40 |
| | 14.4 | | අභ්‍යන්තර විගණන අංශය | 41 |
| | | 14.4.1 | ප්‍රධාන කාර්යයන් | 41 |
| | | 14.4.2 | විෂය පථය | 41 |
| | | 14.4.3 | අභ්‍යන්තර විගණන අංශයේ සත්‍ය කාර්ය මණ්ඩලය | 41 |
| | | 14.4.4 | විගණන කමිටු රැස්වීම් | 42 |
| | | 14.4.5 | 2024 වර්ෂයේ දී ඉදිරිපත් කළ අභ්‍යන්තර විගණන වාර්තා | 42 |
| | | 14.4.6 | දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව | 42 |
| | | 14.4.7 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව | 42 |
| | | 14.4.8 | විශේෂ පැවරුම් වාර්තා | 42 |

| අනු අංකය | | විස්තරය | පිටු අංකය |
|---|---|---|---|
| 14.5 | | තොරතුරු තාක්ෂණ ඒකකය | 43 |
| | 14.5.1 | ප්‍රධාන කාර්යයන් | 43 |
| | 14.5.2 | 2024 වර්ෂයේ තොරතුරු තාක්ෂණ ඒකකයෙන් සිදු කළ කාර්යයන් | 43 |
| | 14.5.3 | තොරතුරු තාක්ෂණ ඒකකයේ සත්‍ය කාර්යය මණ්ඩලය | 43 |
| 14.6 | | ප්‍රවර්ධන ඒකකය | 44 |
| | 14.6.1 | ප්‍රධාන කාර්යයන් | 44 |
| | 14.6.2 | 2024 වර්ෂයේ ප්‍රවර්ධන හා මාධ්‍ය ඒකකයෙන් සිදු කළ කාර්යයන් | 44 |
| | 14.6.3 | ප්‍රවර්ධන ඒකකයේ සත්‍ය කාර්යය මණ්ඩලය | 44 |
| 15 | | පසුගිය වසර 10 ක මූල්‍ය ප්‍රගතියේ විශේෂ අවස්ථා | 45 |
| 16 | | මූල්‍ය විශ්ලේෂණය සහ මෙහෙයුම් කාර්ය සාධනය | 48 |
| 17 | | අනු කමිටු | 49 |
| | | විගණන කමිටු වාර්තාව | 49 |
| | | ආයෝජන කමිටු වාර්තාව | 51 |
| 18 | | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 52 |
| 19 | | 2024 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම | 58 |
| 20 | | අවසන් ගිණුම් ප්‍රකාශන | 66 |
| | | ස්තූතිය | 86 |

# 1. වාර්ෂික වාර්තාව පිළිබඳ හැඳින්වීම

### වාර්තාවේ අන්තර්ගතය

2024 වාර්ෂික වාර්තාවේ අන්තර්ගතය 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ප්‍රධාන කාර්යාලය , දිස්ත්‍රික් කාර්යාල 25 සහ ප්‍රදේශීය ලේකම් කාර්යාල මට්ටමෙන් ක්‍රියාත්මක වන මෙහෙයුම් ආවරණය කරයි. එමෙන්ම යොමුගත වාර්තාවේ මුල්‍ය ප්‍රගතියත්, වසර කිහිපයක මුල්‍ය විශ්ලේෂණයත් ඉදිරිපත් කර ඇත. එමෙන්ම අවසන් මුල්‍ය වාර්තා පිළිබඳ විගණකාධිපතිවරයාගේ මතය හා ඒ පිළිබඳ වන කළමනාකරණයේ අදහස් දැක්වීමක් ඇතුළත් කර ඇත.

### වාර්තාවේ අරමුණ

මෙය ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 29 වන වාර්ෂික වාර්තාව වන අතර, මෙම වාර්තාවේ අරමුණ ආයතනය 2024 වසරේදී එහි ප්‍රතිලාභීන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ට ලබාදී ඇති සේවය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සැපයීමයි.

එමෙන්ම එමගින් උපාය මාර්ග, පාලනය සහ අරමුදල් කළමනාකරණය පිළිබඳ සන්නිවේදනයක්ද ඉදිරිපත් කරන අතර, එහි මුල්‍ය කාර්යය සාධනය සහ මණ්ඩලයේ මං සලකුණු පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් ද ඉදිරිපත් කරයි.

වාර්තාව ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්තවලින් සමන්විත වන අතර, සැසදීම් සහ වැඩිදුර විශ්ලේෂණයන් සඳහා පහසුකම් සැපයීම සඳහා හැකි සෑම තැනකම ප්‍රමාණාත්මක දත්ත සැපයීම අපගේ අරමුණයි.

### වාර්තාවේ අනුකූලතාවය

1971 අංක 38 දරණ මුදල් පනතේ 14 වගන්තිය යටතේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කෙරේ. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිධාන ප්‍රකාරව විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් විගණනය සිදු කර ඇත. ඒ අනුව, විගණකාධිපති වාර්තාවේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා සමාජ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව විගණකාධිපතිවරයාගේ මතය වේ.

### උපාය මාර්ගීක දිශානතිය

වසර පුරා කාර්ය සාධනය කෙරෙහි අවධානය යොමු කිරීමට අමතරව, මෙම වාර්ෂික වාර්තාව පාර්ශවකරුවන්ගේ අභිවෘධිය සඳහා මණ්ඩලයේ වත්මන් සහ අනාගත කාර්යයන් පිළිබඳ අවබෝධයක් ලබාදෙයි.

## 2. අපගේ තේමාව

## රජයේ රැකියාවක් නොකරන ඔබට රාජ්‍ය විශ්‍රාම වැටුපක්

දිනෙන් දින වැඩිවන වැඩිහිටි ජනගහණය සමඟ පොදුවේ රටටත් සමාජයටත් ඇතිවන අභියෝගවලට මුහුණ දීම සඳහා අප මණ්ඩලයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සමඟ සම්බන්ධවීම තම අනාගතය ස්ථාවර කරගැනීමට පිටුවහලක් වනු ඇත. රටේ සංවර්ධනයට විවිධ ආකාරයෙන් දායකවන ව්‍යවසායකයින් , ස්වයං රැකියා නියුක්තිකයන් ඇතුළු රජයේ විශ්‍රාම වැටප් නොලබන පුරවැසියන්ගේ අනාගත සුරක්ෂිතභාවය තහවුරු කිරීමටත්, තමාගෙන් පසු තම පවුලේ සුරක්ෂිතභාවය, එමෙන්ම තම දරුවන් සම්ප්‍රදායික ලෙස රජයේ රැකියා සඳහා යොමු නොකර දරුවන් කැමති රැකියාවක් තොරාගත්තද ඔවුන්ගේ අනාගත සුරක්ෂිතභාවය පිළිබඳ තහවුරු කරගැනීම අප මණ්ඩලයේ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා දායක වීම මඟින් තහවුරු කර ගත හැකිය. එනම් ශ්‍රී ලංකාව තුළ රජයේ රැකියා සඳහා යොමුවීම තුළින් පමණක් අනාගත සුරක්ෂිතභාවය ආරක්ෂාවක් සැපයේ යන මතයෙන් මිදී තම අභිමතය පරිදි රැකියාවක නිරත වී විශ්‍රාම දිවියේ සුරක්ෂිතභාවයක් ඇති කර ගැනීමට මෙම යෝජනා ක්‍රම උපයෝගී වනු ඇත.

## 3. අපගේ දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

### 3.1. දැක්ම

"සමාජ ආරක්ෂණයෙන් සුරක්ෂිත වූ අභිමානවත් ජාතියක්"

### 3.2. මෙහෙවර

"අභිමානවත් ජාතියක් ගොඩනැගීම උදෙසා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා නියාමනය මඟින් යහපාලන ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික, සුරක්ෂිතබව වෙනුවෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ උපාය මාර්ගික සම්බන්ධතා ගොඩ නගමින් තිරසාර සංවර්ධනයක් කරා......"

### 3.3. අපගේ වටිනාකම්

1. මූල්‍ය ආරක්ෂාව : විශ්‍රාම දිවියේ මූල්‍ය සුරක්ෂිතභාවය තහවුරු කිරීම
2. සමාජ ආරක්ෂණ ජාලය : විවිධ වූ සාමාජීය හා ආර්ථික අභියෝගවලට එරෙහිව රැකවරණ ජාලයක් වීම.
3. තිරසාරභාවය : තිරසාර පැවැත්මක් සඳහා වත්මන් සහ අනාගත පරම්පරාවන්ගේ සමාජ ආරක්ෂණය සහතික කිරීම.
4. තේරීම සහ නම්‍යශිලී බව : පුද්ගලවරණය සහ මූල්‍ය ශක්‍යතාව අනුව නව්‍යශීලි තේරීමක් සහිත සේවාවක් සැපයීම.
5. සවිබලගැන්වීම : මූල්‍ය සැලසුම් තුළින් පුද්ගලයන් සවිබලගැන්වීම

## 4.සභාපතිතුමාගේ සුභ පැතුම් පණිවිඩය



1999 අංක 33 දරණ පනතින් සංශෝධිත 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත ප්‍රකාරව අවිධිමත් ක්ෂේත්‍ර එනම් ස්වයං රැකියා ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වාදී ක්‍රියාත්මක කිරීම සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන අරමුණ වේ. අවුරුදු 30ක් තිස්සේ විවිධ උත්සහයන් යටතේ උක්ත පිරිසගෙන් සමාජ ආරක්ෂණය පිළිබඳව වැඩසටහන් ක්‍රියාත්මක වුවද ශ්‍රී ලංකා ජන සමාජයට ආර්ථිකයට දැනෙන ආකාරයට සිදුවී නොමැති බව මාගේ නිරීක්ෂණයයි. විවිධ ආණ්ඩු යටතේ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා අඩු වැඩි වශයෙන් අනුග්‍රහය ලැබී තිබුණද ඉදිරිපත් කරන ලද යෝජනා ක්‍රමද ඉලක්ක වී ඇත්තේ දිළිඳු ප්‍රජාවගේ සුභසාධනය අරමුණු කරගෙන බව මාගේ අවබෝධයයි.

වර්ථමාන රජයේ ප්‍රතිපත්තිය අනුව ඉදිකිරීම්, සංචාරක, විගමණික හා ප්‍රවාහන වැනි ක්ෂේත්‍ර ගණනාවක නියැලෙන පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණය හා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම හඳුන්වාදෙන බව "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන්ව ඇත. එම මහගු කාර්යය කිරීමේ වගකීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය වෙත පැවරී ඇත.

එබැවින් පනත මඟින් පැවරී ඇති අරමුණු පුළුල් ලෙස අර්ථ කථනය කරමින් විවිධ ක්ෂේත්‍රවල නියැලි ස්වයං රැකියාවල නියුතු පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණය ලබාදීම සඳහා මණ්ඩලයේ සියලු දෙනා ක්‍රියාත්මක විය යුතුව ඇත. එමෙන්ම, අප මණ්ඩලයේ කාර්යක්ෂමතාවය හා සඵලදායිතාවය සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීම ඉදිරි කාලය තුල කඩිනමින් කල යුතුව ඇත.

කෙසේ වෙතත් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අභිලාෂයන් උදෙසා කැපවූ කාර්ය මණ්ඩලයේ සියළුම නිලධාරීන්ට මාගේ හදපිරි කෘතඥතාව පුද කරමි.

එම්.කේ.බී.දිසානායක
සභාපති

## 5.අධ්‍යක්ෂ මණ්ඩලය - 2024



**ඉංජිනේරු ශාන්ත දික්වැල්ල මහතා**
සභාපති
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
(2022.12.21 දින සිට 2024.09.24 දින දක්වා)



**එම්.කේ.බී.දිසානායක මහතා**
සභාපති
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
(2024.11.04 දින සිට සභාපති තනතුරේ කටයුතු කරනු ඇත.)



**ඉංජිනේරු අරුණ කුමාරවඩු මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(2023.05.16 දින සිට 2025.01.30 දින දක්වා)



**එච් .ඒ. බෝගොඩගෙදර මහත්මිය**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික - මහා භාණ්ඩාගාර නියෝජිත)
(2023.09.08 දින සිට 2025.01.03 දින දක්වා)



**කේ.කේ.ඩී.කුමාරසිරි කන්නන්ගර මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(2023.04.18 සිට 2025.01.30 දින දක්වා )



**කේ.එච්.වී. ජයතිලක මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(2023.04.18 සිට 2024.06.27 දින දක්වා )



**කේ.කේ. ගජපාල මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(2023.12.08 දින  සිට 2024.11.04 දින දක්වා )



**කේ.කේ.ඒ. කපුරුබණ්ඩාර මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
(2023.12.08 සිට 2024.10.31 දින දක්වා )

## 6. විගණන කමිටුව - 2024

01. හිමාලි බෝගොඩගෙදර මහත්මිය - කමිටු සභාපති ( භාණ්ඩාගාර නියෝජිත)

02. කේ.කේ.ඩී.කුමාරසිරි කන්නන්ගර මහතා - කමිටු සාමාජික
(2024.03.21 , 2024.07.17 හා 2024.09.12 දින පැවති විගණන කමිටු සඳහා සහභාගී වී ඇත)

03. කේ.එච්.වී.ජයතිලක මහතා - කමිටු සාමාජික
(2024.03.21 දින පැවති විගණන කමිටුව සඳහා සහභාගී වී ඇත)

04. කේ.කේ.ගජපාල මහතා - කමිටු සාමාජික
(2024.07.17 හා 2024.09.12 දින පැවති විගණන කමිටු සඳහා සහභාගී වී ඇත)

## විගණන කමිටු නිරීක්ෂකයන්

ඩී.එම්.ජී.පී.මල්කාන්ති මිය - නිරීක්ෂක (ප්‍රධාන අභ්‍යන්තර විගණක - රේඛීය අමාත්‍යාංශය)

එම්.ඩී.කේ.මලගල මිය / කේ.කරුණාරත්න මහතා - නිරීක්ෂක (ජාතික විගණන කාර්යාලය)

## 7.සාමාන්‍යාධිකාරීතුමාගේ සමාලෝචනය



රජයේ සේවකයන් සඳහා රාජ්‍ය විශ්‍රාම වැටුප් ක්‍රමයද, අර්ධ රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය සඳහා සේවක අර්ථ සාධක අරමුදල් ක්‍රමයද, ගොවි හා ධීවර ක්ෂේත්‍ර සඳහා ගොවි හා ධීවර විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ක්‍රියාත්මක වුවද, ස්වයං රැකියාවල නියුතු දහස් සංඛ්‍යාත සේවා නියුක්තිකයන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයකින් ආවරණය නොවීම නිසා ඇති වූ රික්තකය සඳහා 1996 දී ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය (ශ්‍රී.ලං.ස.ආ.ම) පිහිටුවා ඇත.

ශ්‍රී.ලං.ස.ආ.ම ය ස්වයං රැකියා නියුක්තිකයන්ගේ ශරීර ශක්තිය හීන වීම, වයෝවෘද්ධභාවය හා මරණය යන කරුණු හේතුකොට ගෙන ඉපයීම් නොමැති වීමෙන් හෝ සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීමක් නිසා සිදුවිය හැකි ආර්ථික හා සාමාජීය ආපදා පිටු දැකිම අරහයා පොදු සහන ක්‍රියාවලියක් ලෙස විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරයි.

ශ්‍රී.ලං.ස.ආ.ම වසර 28 ක ගමන් මග තුළ පසුගිය වසර කිහිපයේ ලබාගත් වර්ධනය 2024 වර්ෂයෙත් අඛණ්ඩව පවත්වා ගැනීමට හැකි වූ බව සතුටින් ප්‍රකාශ කර සිටිමි.

2024 වර්ෂයේ සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවලට නව සාමාජිකයන් 58,980 ක් ඇතුළත් කර ගැනීමටද, රු.මිලි.770.29 ක් විශ්‍රාම වැටුප් අරමුදලට එකතු කිරීමටද, රු.මිලි.461.7 ක් ප්‍රතිලාභ ලෙස සමාජ ගත කිරීමට හැකිවිය.

2020 වසරේ 25,778 ක් පැවැති නව බඳවාගැනීම් පිළිවෙලින් පසුගිය වර්ෂ 3 තුළ 57,803 ක්, 56,764 ක්, 66,448 ක් ලෙස වර්ධනය කර ගැනීමටත්, 2020 වසරේ 476.56 ක් පැවැති විශ්‍රාම වැටුප් අරමුදලට එකතු කල මුදල පිළිවෙලින් පසුගිය වර්ෂ 3 තුළ රු.මිලි.524.69 ලෙස ද, රු.මිලි. 685.91 ලෙස ද, රු.මිලි.932.09 ලෙස ද වර්ධනය කර ගැනීමට හැකි විය. තවද 2020 වසරේ රු.මිලි. 1.86 පැවැති අරමුදලේ ආයෝජන මුදල 2024 අවසාන වන විට රු.මිලි.3.35 ක් දක්වා වර්ධනය කර ගැනීමට හැකි වී ඇත.

ජනමාධ්‍ය සහ සමාජ මාධ්‍ය හරහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ප්‍රචලිත කිරීමේ වැඩසටහන් පැවැත්වීමට අමතරව 2023 වර්ෂයේ දීප ව්‍යාපත්ව ස්වයං රැකියා ධෛර්යමත් කිරීම සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම සඳහා ස්වයං රැකියා නියුක්ති කණ්ඩායම්, වෘත්තීය පුහුණු ආයතනවල සිසුන් සහ පාසැල් සිසුන් සඳහා වැඩසටහන් 4,000 ක් පමණ පැවැත්වීමට කටයුතු කර ඇත.

2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය හා වාර්ෂික වාර්තාව සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද "හොඳම වාර්ෂික වාර්තා සහ ගිණුම් සම්මාන - 2023" තරඟයේ සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා අධිකාරී කාණ්ඩය යටතේ දෙවන ස්ථානය සඳහා හිමිවන රිදී සම්මානය ලබා ගැනීමට අප මණ්ඩලයට හැකි විය.

අප මණ්ඩලයේ සමාජ ආරක්ෂණ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්තුමන්ලාත්, ප්‍රාදේශීය ලේකම්තුමන්ලාත්, තැපැල් දෙපාර්තමේන්තුව සහ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව අපගේ කොටස්කරුවන් ලෙස සහයෝගය දක්වමින් කටයුතු කිරීම මණ්ඩලයට විශාල ශක්තියක් වී ඇත.

කෙසේ වුවද, අප අරමුදලේ සාමාජිකත්වය ලබා ඇති දායකයින්ගේ පසු වාරික රැස් කිරීම විධිමත් කර අක්‍රියවීම් අවම කිරීම සඳහාත්, මෙහෙයුම් කටයුතු නව තාක්ෂණය සමග ඒකාබද්ධකිරීමටත්, ශ්‍රී.ලං.ස.ආ.ම පනත සඳහා අවශ්‍ය කාලීන සංශෝධනයන් කිරීමටත්, නව ආකර්ෂණීය යෝජනා ක්‍රම හඳුන්වාදීමටත් ඉදිරියේ ජය ගැනීමට ඇති අභියෝග වන අතර, ඒ සඳහා අවශ්‍යය වන වැඩපිළිවෙල 2024 වසරේ දී ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

2024 වර්ෂයේ ඉහළ කාර්යය සාධනය අත්පත් කර ගැනීම සඳහා නිසි මඟපෙන්වීම හා උපදෙස් ලබාදුන් ගරු විෂය භාර අමාත්‍යතුමන්ලාටත්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශ ලේකම්තුමාටත්/තුමියටත්, විෂය භාර අතිරේක ලේකම්තුමියටත්, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයටත් කාර්ය සාධනය ලඟා කර ගැනීම සඳහා කණ්ඩායමක් ලෙස එකට කටයුතු කල ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සභාපතිතුමා ඇතුළු සියලු කාර්යය මණ්ඩලයටත් ස්තූතිය හිමි වේ.

සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
2025.06.30

# 8.කළමනාකරණ කණ්ඩායම (2024.12.31 දිනට)

## 8.1. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය



**කේ.ඒ.එස්.පී.කළුආරච්චි මහතා**
සාමාන්‍යාධිකාරී
දුරකතන : +94 11 2886581
ෆැක්ස් : +94 11 2886581
ඊමේල් : gm@ssb.gov.lk



**කල්හාරි ද සිල්වා මහත්මිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ)
දුරකතන : +94 11 2886582
ෆැක්ස් : +94 11 2886582
ඊමේල් : dgm.socialsecurity@ssb.gov.lk



**කේ.බී.ජී.එච්.එන්.කාරියවසම් මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)
දුරකතන : +94 11 2886583
ෆැක්ස් : +94 11 2886583
ඊමේල් : dgm.finance@ssb.gov.lk



**කපිල ක්‍රිෂාන්ත මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී
(බඳවාගැනීම් හා දිස්ත්‍රික් පරිපාලන)
දුරකතන : +94 11 5745357
ෆැක්ස් : +94 11 2886582
ඊමේල් : agm.socialsecurity@ssb.gov.lk



**ශ්‍යාමලී ප්‍රින්සි හෙට්ටිආරච්චි මෙනවිය**
සහකාර සාමාන්‍යාධිකාරී
(විශ්‍රාම වැටුප්/රක්ෂණ)
දුරකතන : +94 11 2889220
ෆැක්ස් : +94 11 2886582
ඊමේල් : agm.pension.ins@ssb.gov.lk



**දයානි පුෂ්පලතා මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (පාලන)
දුරකතන : +94 11 2886585 – 86
ඊමේල් :



**අජිත් කුමාර මහතා**
අභ්‍යන්තර විගණක
දුරකතන : +94 11 2865820
ෆැක්ස් : +94 11 2865820
ඊමේල් : int.audit@ssb.gov.lk

## 8.2.තෘතීය කළමනාකාරීත්වය



**එම්.එම්.මානෙල් ජයසේකර මිය**
කළමනාකරු (ඔප්පු සේවා)
දුරකතන : +94 11 2886585 – 86
ඊමේල් : mgr.policy@ssb.gov.lk



**එච්.ජී.බී.ශිරාණි මෙනවිය**
ගිණුම් නිලධාරි (මුදල්)
දුරකතන : +94 11 2886585 – 86
ඊමේල් : mgr.finance@ssb.gov.lk



**ඩී.එස්. ලක්මාල් මහතා**
සමාජ ආරක්ෂණ නිලධාරි (ප්‍රවර්ධන)
දුරකතන : +94 11 2886585 – 86
ඊමේල් : mgr.promotions@ssb.gov.lk



**එම්.එච්.එස්.යූ.කරුණාරත්න මිය**
සමාජ ආරක්ෂණ නිලධාරි ( විශ්‍රාම වැටුප්)
දුරකතන : +94 11 2886585 – 86
ඊමේල් : mgr.pension@ssb.gov.lk



**එච්.ජී.එම්.ලක්මාලි ආරියදාස මිය**
සමාජ ආරක්ෂණ නිලධාරි (තොරතුරු තාක්ෂණ)
දුරකතන : +94 11 2886585 – 86
ඊමේල් : mgr.it@ssb.gov.lk



**බී.ජී.එස්.කුමාරි කරුණාරත්න මිය**
සමාජ ආරක්ෂණ නිලධාරි (රැස්කිරීම්)
දුරකතන : +94 11 2886585 – 86
ඊමේල් : mgr.collections@ssb.gov.lk



**පී.ප්‍රතීපන් මහතා**
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරි
(උතුරු නැගෙනහිර පළාත්)



**රංජිත් දිසානායක මහතා**
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරි
(මධ්‍යම, වයඹ සහ උතුරු මැද පළාත්)



**වයි.එච්.එම්.සිරියලතා මහත්මිය**
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරි
(සබරගමු පළාත හා විශේෂ ව්‍යාපෘති 2)



**කේ.ජී.ඒ.චන්ද්‍රා මාලනී මහත්මිය**
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරි
(දකුණු සහ ඌව පළාත්)



**ඩී.එම්.එස්.කේ.කේ.දසනායක මහතා**
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරි
(බස්නාහිර පළාත සහ විශේෂ ව්‍යාපෘති 3)

## 9. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය



## 10.අගය නිර්මාණය කිරීමේ මාදිලිය

**අගයන් සබලකාරක (ආදාන)**

**ආයෝජන ප්‍රාග්ධනය**

- සාමාජික අරමුදල -රු.මිලියන 3,422.25

**සාමාජික ප්‍රාග්ධනය**

- මුළු සාමාජික සංඛ්‍යාව - 1,023,351

**සේවක ප්‍රාග්ධනය**

- මුළු කාර්ය මණ්ඩලය - 150
- කාර්ය මණ්ඩලයෙන් 25% වැඩි පිරිසකට මණ්ඩලය සමඟ වසර 10 කට වැඩි පළපුරුද්දක් ඇත.
- දක්ෂ , පුහුණු සහ සුදුසුකම් සහිත කාර්ය මණ්ඩලය

**හවුල්කාර ප්‍රාග්ධනය**

- ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
- මුදල් අමාත්‍යාංශය
- ජාතික විගණන කාර්යාලය
- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
- දිස්ත්‍රික් ලේකම්වරුන් , ප්‍රෙද්ශීය ලේකම්වරුන්
- සමාජ සේවා නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්
- මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව
- තැපැල් දෙපාර්තමේන්තුව
- සමුපකාර ග්‍රාමීය බැංකු ජාලය

**සමාජ සහ ප්‍රජා ප්‍රාග්ධනය**

- වැඩකරන පුද්ගලයින්

**අගය නිර්මාණය (ක්‍රියාවලි)**

දැක්ම, මෙහෙවර සහ වටිනාකම්

ඉලක්ක හා අරමුණු

උපාය මාර්ග සහ කටයුතු

මූලික කටයුතු

- රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් නොමැති තැනැත්තන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා විශ්‍රාම වැටුප් ලබාදීම.
- හදිසි අකර්මන්‍යතාවයන්හිදී හා මරණයේදී මූල්‍ය සහනය ලබාදීම
- විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ පතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම

ද්විතීය කටයුතු

- මූල්‍ය
- තොරතුරු තාක්ෂණ
- මානව සම්පත්
- අභ්‍යන්තර විගණන

1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත හා 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධිත) පනත මඟින් ස්ථාපිත කර ඇත.

**නිර්මාණය කල වටිනාකම (නිමැවුම්)**

**ආයෝජකයන්**

- ආයෝජිත මුදල - රු.මිලියන 314.64
- ආයෝජනය මත ප්‍රතිලාභ- රු.මිලියන 33.60

**සාමාජිකයින්**

- 2024 වර්ෂයේ සාමාජික බඳවාගැනීම්- 55,980
- 2024 වර්ෂයේ රැස්කල පළමු වාරික මුදලෙහි වටිනාකම - රු.මිලියන 167.42

**සේවකයින්**

- පුද්ගල වියදම් - රු.මිලියන 126.03

**ප්‍රජාව**

- විශ්‍රාම වැටුප් ගෙවීම් - රු.මිලියන 426.41
- මරණ පාරිතෝෂික ගෙවීම්- රු.මිලියන 0.533
- අබාධිත පාරිතෝෂික ගෙවීම් - රු.මිලියන 0.63
- අතිරේක ප්‍රතිලාභ - රු.මිලියන 8.926
- ශුද්ධ ආයක මුදල් - රු.මිලියන 25.20

# 11. “ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය” යනු කුමක්ද?

## 11.1. ව්‍යවස්ථාපිත අරමුණු

1999 අංක 33 දරණ පනතින් සංශෝධිත 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත සහ 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/ 05 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි අංක 04 අනුව විශ්‍රාම වැටුප් හිමිකම ලබා නොසිටින හෝ විශ්‍රාම වැටුප් සහිත තනතුරක් නොදරන, සියලු සේවා නියුක්තිකයන් වෙත සමාජ ආරක්ෂණ හා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ප්‍රධාන අරමුණ වේ.

ඒ අනුව,

- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන් වයෝවෘද්ධ කාලයේදී හෝ ඔවුන් යම් අශක්නුතාවයකය පත්වූ විට එම කාලයේදී ඔවුන්ට සමාජ ආරක්ෂණය සැලසීම.
- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් මියගිය විට, ඔවුන්ගේ යැපැන්නන්ට සහන සැලසීම.
- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට ඔවුන්ගේ අදාළ වෘත්තීයවල යෙදෙන ලෙස දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩි දියුණු කිරීම.
- ස්වයං රැකියාවල යෙදෙන තරුණයන් දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩි දියුණු කිරීම.
- සකසුරුවම් වීම හා සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් දැනුවත් කිරීම.
- ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම.

## 11.2. කාර්යභාරය

රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති තැනැත්තන් වෙත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාදීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය වේ.

1996 අංක 17 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පනතේ ප්‍රකාරව 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/5 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කරන ලද යෝජනාක්‍රම 06 ක් ක්‍රියාත්මක කරන ලදී.

ආර්ථික වශයෙන් ඵලදායී යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම හා සාමාජිකයින් වෙත ඉහළ හා සුරක්ෂිත විශ්‍රාම වැටුපක රැකවරණය සැලසීම පෙරදැරිව වර්තමානය වන විට “සුරැකුම” යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇත.

සුරැකුම යෝජනා ක්‍රමය සඳහා වයස අවුරුදු 18 සිට 59 දක්වා රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති තැනැත්තන්ට දායකවිය හැකි අතර, වාරික ගෙවීමේ හැකියාව මත සාමාජිකයාට අවශ්‍ය ප්‍රමාණයක විශ්‍රාම වැටුප් ලබාගත හැකිය.

2012 ඔක්තෝම්බර් 11 දිනට යෙදී තිබුණ "ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දිනය" ට සමගාමීව "ආරස්සාව" පූර්ව සැලසුම් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. එම යෝජනා ක්‍රමය සඳහා වයස අවුරුදු 18ට අඩු දරුවන්, සිය දෙමාපිය/ භාරකරු භාරකත්වය යටතේ සාමාජික කල හැකි අතර, වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු ඔවුන් සුරැකුම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට මාරුකර ගිණුමේ පවතින ශේෂය අනුව විශ්‍රාම වැටුප් හිමිකම ලබාදේ.

## 11.3. අපගේ සේවාවන්

රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති විවිධ වූ ඉලක්කගත කණ්ඩායම් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනාක්‍රම හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම ප්‍රධානතම සේවාව වේ .ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මගින් හඳුන්වා දී ඇති විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම කිහිපයකි.

### 11.3.1. ප්‍රධාන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම

- **"සුරැකුම"** විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනාක්‍රමය.
- **"ආරස්සාව"** පූර්ව සැලසුම් විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය.

### 11.3.2. විශේෂිත විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම

විශේෂිත ඉලක්කගත කණ්ඩායම් වෙනුවෙන් ඔවුන්ගේ අවශ්‍යතාවයන් අනුව හඳුන්වා දී ඇති සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම

- **"කලාකරු"** විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය.
- **"නාවිකයා"** සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය.
- **"මනුසවි"** සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය.
- **"බුදුපුත් මාපිය හරසර"** විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය.

## 11.4.යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ

- වයස අවුරුදු 60 සිට වයස අවුරුදු 80 දක්වා සාමාජිකයාට මාසිකව විශ්‍රාම වැටුප ලබාදීම.
- සාමාජිකයා විශ්‍රාමිකයෙකු ලෙස මියගිය විට සමාජිකයාගේ වයස අවුරුදු 80 දක්වා කලත්‍රයාට විශ්‍රාම වැටුප ගෙවීම.
- ස්ථිර අර්ධ අබලතාවක දී වයස අනුව ගැලපූ රු.25,000/- දක්වා පාරිතෝෂික මුදලක් සහ නියමිත වාරික ගෙවීමෙන් පසු වයස අවුරුදු 60 සිට විශ්‍රාම වැටුප
- ස්ථිර පූර්ණ අබලතාවක දී වයස අනුව ගැලපූ රු.50,000/- දක්වා පාරිතෝෂිකය සහ ශුද්ධ දායක මුදල හෝ අබලතාවට පත් වූ දිනයේ සිට ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුප
- විශ්‍රාම ලැබීමට පෙර සාමාජිකයා මියගියහොත් යැපෙන්නන්ට එකවර ගෙවනු ලබන පාරිතෝෂිකයක් ලබාදීම.

යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබාගැනීම මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෙනත් බලය පවරන ලද නිලධාරින් මගින් සිදුකළ හැකිය.

වාරික ගෙවීම ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, තැපැල් කාර්යාල හා බලය පවරන ලද ග්‍රාම නිලධාරින් මගින් හා මෙම මණ්ඩලයේ කාර්යාල මගින් සිදුකළ හැකිය.

## 11.5. "සුරැකුම" විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය



වයස අවුරුදු 18 ට වැඩි සහ 59 ට අඩු රජයේ විශ්‍රාම වැටුපක් සහිත රැකියාවක නොයෙදෙන පුද්ගලයන් සඳහා ක්‍රියාත්මකවන යෝජනා ක්‍රමයකි. මේ යටතේ සාමාජිකවීමට මනාප පුද්ගලයකුහට තම අවශ්‍යතාවය සහ දායක මුදල් ගෙවීමේ හැකියාව අනුව කැමති ඕනෑම ප්‍රමාණයක විශ්‍රාම වැටුපක් සකස්කර ගැනීමේ හැකියාව පවතී.

### 11.5.1. "සුරැකුම" යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ

- **විශ්‍රාම වැටුප**

  ඔප්පුව කල්පිරුණු සාමාජිකයකු (වයස අවුරුදු 60 ඉක්මවූ) වෙත සිය ජීවිතාන්තය දක්වා ගිවිසගත් විශ්‍රාම වැටුප මාසිකව ගෙවනු ලැබේ. සාමාජිකයකු විසින් සියළු වාරික මුදල් නිසිපරිදි ගෙවා ඇති විට 100% ක විශ්‍රාම වැටුපක් හිමිවේ.

  ගිණුම කල්පිරෙන අවස්ථාවේදී ශුද්ධ ගිණුම් ශේෂය විශ්‍රාම වැටුපට සාපේක්ෂව 75% ත් 100% ත් අතර පවතී නම් එම වාරික මුදලට අනුරූපව ගලපන ලද විශ්‍රාම වැටුපක් ලබාගැනීමේ හැකියාව විශ්‍රාමිකයාට හිමිවේ.

- **කලත්‍රයාට විශ්‍රාම වැටුප**

  ඔප්පුව කල්පිරී මාසික විශ්‍රාම වැටුප ලබාගැනීම ආරම්භ කළ විශ්‍රාමිකයකු අවුරුදු 80 එළඹීමට පෙර මරණයට පත්වුවහොත් ඒ වනවිට ඔහුගේ/ඇයගේ කලත්‍රයා ජීවත්ව සිටීනම්, විශ්‍රාමිකයාට අවුරුදු 80 දක්වා ලබාගැනීමට නියමිතව තිබූ විශ්‍රාම වැටුප, විශ්‍රාමිකයාගේ වයස අවුරුදු 80 හෝ එකී කලත්‍රයා මිය යන දිනය යන දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා ලබාගැනීමට කලත්‍රයාට හිමිකම ලැබේ.

- **ස්ථිර අර්ධ අබලතාවය**

I. හදිසි අනතුරක හෝ රෝගයක ප්‍රතිඵලයක් වශයෙන් යම් දායකයකු
   - එක් ඇසක පෙනීම නැතිවීම
   - එක් අතක් නැතිවීමෙන් හෝ එක් අතක් ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීම හෝ
   - එක් පාදයක් නැතිවීමෙන් හෝ එක් පාදයක් ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීම, එම දායකයා ස්ථිර අර්ධ අබලතාවයට පත්වූවකු ලෙස සැලකේ.

II. ප්‍රතිලාභය

විශ්‍රාම ලැබීමට පෙර දායකයා ස්ථිර අර්ධ අබලතාවයකට පත්වුවහොත් එකවර ගෙවනු ලබන රු. 6,000.00 සිට රු.25,000.00 දක්වා අර්ධ අබලතා පාරිතෝෂිකයක් සහ අදාළ වාරික මුදල් නොකඩවා ගෙවන්නේ නම් විශ්‍රාම ලබන වයසේ සිට ජීවිතාන්තය දක්වා ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුපක් ලබාගත හැක. පාරිතෝෂිකය ලබාගෙන යෝජනා ක්‍රමයෙන් ඉවත් වන්නේ නම් පාරිතෝෂිකය සමඟ දායකයාගේ නමින් තැන්පත්ව ඇති ශුද්ධ දායක මුදල ද ආපසු ගෙවනු ලැබේ.

- **ස්ථිර පූර්ණ අබලතාවය**

I. යම් හදිසි අනතුරක හෝ රෝගයක ප්‍රතිඵලයක් වශයෙන් යම් දායකයෙකු

- අත්දෙකම නැතිවීමෙන් හෝ අත් දෙකම ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන්
- පා දෙකම නැතිවීමෙන් හෝ පා දෙකම ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන්
- ඇස් දෙකේම පෙනීම නැතිවීමෙන්
- එක් අතක් නැතිවීමෙන් හෝ ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන් සහ එක් පාදයක් නැතිවීමෙන් හෝ ස්ථිර වශයෙන් අබලතාවයට පත්වීමෙන්
- එක් අතක් හෝ පාදයක් නැතිවීමෙන් සහ එක් ඇසක පෙනීම නැතිවීමෙන් හෝ එක් පාදයක් හෝ අතක් ස්ථිර වශයෙන් අබලතාවට පත්වීමෙන් සහ එක් ඇසක පෙනීම නැතිවීමෙන් හෝ
- බෙල්ලෙන් පහළ පූර්ණ පක්ෂඝාතයකට ලක්වීමෙන්, පීඩාවකට පත්වන අවස්ථාවක දායකයා ස්ථිර වශයෙන්ම පූර්ණ ආබාධිත තත්වයකට පත්වූවකු ලෙස සලකනු ලැබිය යුතුය.

II. ප්‍රතිලාභය

විශ්‍රාම ලැබීමට පෙර දායකයා ස්ථිර පූර්ණ අබලතාවයකට පත්වුවහොත් තම කැමැත්ත පරිදි එකවර ගෙවනු ලබන රු. 12,000.00 සිට 50,000.00 දක්වා පූර්ණ අබලතා පාරිතෝෂිකයක් හෝ අබලතාවයට පත්වූ දින සිට ජීවිතාන්තය දක්වා ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුපක් ලබාගත හැක. පාරිතෝෂිකය ලබාගෙන යෝජනා ක්‍රමයෙන් ඉවත් වන්නේ නම් පාරිතෝෂිකය සමඟ දායකයාගේ නමින් තැන්පත්ව ඇති ශුද්ධ දායක මුදල ද ආපසු ගෙවනු ලැබේ.

- **මරණ පාරිතෝෂිකය**

විශ්‍රාම ලැබීමට පෙර මරණයට පත්වන සාමාජිකයකු වෙනුවෙන් රු. 25000/- දක්වා වූ මරණ පාරිතෝෂිකයක් සහ දායකයාගේ නමින් තැන්පත්ව ඇති ශුද්ධ දායක මුදල උරුමකරුවන් වෙත හිමිවේ.

- **ශුද්ධ දායක මුදල ආපසු ගෙවීම**

ඔප්පුව කල්පිරෙන අවස්ථාවේ දී,

I. ගෙවිය යුතු මුළු වාරික සංඛ්‍යාවෙන් 25% ත් 75% ත් අතර ප්‍රමාණයක් ගෙවා ඇත්නම්, ගෙවූ මුදල් ඊට අදාල පොලියද සමඟ (**ශුද්ධ දායක මුදල**) සාමාජිකයාට ආපසු ගෙවනු ලැබේ.

II. ගෙවිය යුතු මුළු වාරික සංඛ්‍යාවෙන් 75% ත් 100% ත් අතර ප්‍රමාණයක් ගෙවා ඇත්නම්, ඊට අනුරූපව ගලපන ලද විශ්‍රාම වැටුපක් ගෙවනු ලැබේ.

III. ගෙවිය යුතු මුළු වාරික සංඛ්‍යාවෙන් 25% කට වඩා අඩුවෙන් ගෙවා ඇත්නම්, ගෙවූ මුදල් මණ්ඩලය සතු වේ.

## 11.6. “ආරස්සාව” පූර්ව සැලසුම් යෝජනා ක්‍රමය



උපතේ සිට වයස අවුරුදු 17 දක්වාවන දරුවන් වෙනුවෙන් හඳුන්වා දී ඇති පූර්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයකි. මේ යටතේ දෙමාපිය/භාරකරුවකුගේ භාරකාරත්වය යටතේ දරුවන් සාමාජික කළ හැකි අතර, වයස අවුරුදු 18 වනවිට ගිණුම කල්පිරේ. එම කල්පිරුණු ගිණුම් ශේෂය පදනම්ව සුරැකුම යෝජනා ක්‍රමයට එකවර මුදල් ගෙවා දායකවීමේ පදනම යටතේ අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

### 11.6.1. “ආරස්සාව” පූර්ව සැලසුම් ක්‍රමයේ ප්‍රතිලාභ

**අධ්‍යාපන කඩඉම් ප්‍රතිලාභ**

I. 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් අවම දිස්ත්‍රික් පරිසාධන ලකුණු මට්ටම සම්පූර්ණ කර විභාග සමත්වීමේදී ගිවිසගත් මාසික විශ්‍රාම වැටුප් වටිනාකමින් 50% ක මුදලක් ප්‍රදානය කිරීම.

උදා. - රුපියල් 100,000ක විශ්‍රාම වැටුපක් නම් රුපියල් 50,000ක් හිමිවේ.

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ විෂයන් 5 කට විශිෂ්ඨ සාමාර්ථ සහිතව සියළුම විෂයන් සමත්වීමේදී ගිවිසගත් මාසික විශ්‍රාම වැටුප් මුදලට සමාන මුදලක් ප්‍රදානය කිරීම.

උදා. - රුපියල් 100,000ක විශ්‍රාම වැටුපක් නම් රුපියල් 100,000ක් හිමිවේ.

III අධ්‍යයන පොදු සහතික පත්‍ර(උසස් පෙළ) විභාගය සමත්ව ජාතික විශ්ව විද්‍යාලයකට ප්‍රවිෂ්ඨ ලද විට ගිවිසගත් විශ්‍රාම වැටුප් මුදල මෙන් දෙගුණයක් ප්‍රදානය කිරීම.

උදා. - රුපියල් 100,000ක විශ්‍රාම වැටුපක් නම් රුපියල් 200,000ක් හිමිවේ.

**අනෙකුත් ප්‍රතිලාභ**

දරුවාගේ වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු ගිණුමේ පවත්නා ශේෂය දරුවා නමින් “සුරැකුම” විශ්‍රාම වැටුප් සැලසුමට මාරු කරනු ලබන අතර එදින සිට දරුවා “සුරැකුම” විශ්‍රාම වැටුප් සැලසුමට අදාළ පහත ප්‍රතිලාභ සඳහා හිමිකම් ලබයි.

- වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා මාසික විශ්‍රාම වැටුප
- කලත්‍රයා වෙත විශ්‍රාම වැටුප
- මරණ පාරිතෝෂික
- ස්ථිර අර්ධ අබලතා ප්‍රතිලාභ
- ස්ථිර පූර්ණ අබලතා ප්‍රතිලාභ

**වෙනත් කොන්දේසි,**

I. අධ්‍යාපන ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා වාරික වශයෙන් ගෙවීමේදී විභාගය පැවැත්වෙන දිනට වර්ෂයකට පෙර දායකත්වය ලබා තිබිය යුතු අතර එකවර ගෙවීමේදී විභාගය පැවැත්වෙන දිනට පෙර සාමාජිකත්වය ලබා තිබිය යුතුය.

II. ප්‍රතිඵල නිකුත් වී දින 90ක් ඇතුලත එම ඉල්ලීම ඉදිරිපත් කළ යුතුයි.

III. රු.10,000කට වැඩි විශ්‍රාම වැටුපක් සඳහා දායකත්වය ලබා තිබිය යුතුය

## 12.තිරසාර සංවර්ධන ඉලක්ක

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය වගකිව යුතු ව්‍යවස්ථාපිත අර්ධ රාජ්‍ය ආයතනයනක් ලෙස මණ්ඩලයේ කෙටි කාලීන , මධ්‍ය කාලීන සහ දිගු කාලීන උපාය මාර්ග තුළ තිරසාර සංවර්ධන අරමුණුවලින් අංක 1.3 හා 8.3 අන්තර්ගත කිරීම මඟින් එම ඉලක්ක සපුරා ගැනීමට දායක වේ.







සියලු තන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම

1.3

පහළ මට්ටමේ අයත් ඇතුළත්ව සියළුම පුද්ගලයින් සම්බන්ධයෙන් ජාතික වශයෙන් සුදුසු වන්නා වූ සමාජ ආරක්ෂණ ක්‍රම ක්‍රියාවට නැංවීම සහ **2030** වන විට දරිද්‍රතාවෙන් පෙළෙන සහ අවදානම් කණ්ඩායම් ප්‍රමාණවත් ලෙස එමගින් ආවරණය වී තිබීම

සුනිසි මෙහෙවර සහ ආර්ථික වර්ධනය

8.3

ඵලදායී ක්‍රියාකාරකම් වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලීභාවයට සහාය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තීන් ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමට අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම සහ සංවර්ධනය කිරීම දිරිගැන්වීම.

**තිරසාර සංවර්ධන අරමුණුවලින් 1.3 හා 8.3 අරමුණ ළඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන් /ව්‍යාපෘති හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් /ව්‍යාපෘති**

1.අස්වැසුම ප්‍රතිලාභීන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයට ඇතුළත් කිරීම මඟින් අස්වැසුම ප්‍රතිලාභීන් සඳහා සමාජ ආරක්ෂණය සැලසීම.

2. විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සඳහා නව සාමාජිකයින් බඳවා ගැනීම මඟින් රජයේ විශ්‍රාම වැටුපක් නොමැති පුද්ගලයන්ට / ඔවුන්ගේ යැපෙන්නන්ට සමාජ ආරක්ෂණය සැලසීම.

3. විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීම් මඟින් විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකයන් සඳහා විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීම.

4. ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මඟින් ස්වයං රැකියාවල නිරත තැනැත්තන් දිරිමත් කිරීම, හැකියා හා දක්ෂතා වැඩිදියුණු කිරීම හා මුල්‍ය සම්පත් කළමනාකරණයේ ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කිරීම.

5. හිඟ වාරික එකතු කිරීම මඟින් සාමාජිකත්වය සක්‍රියව පවත්වා ගැනීම සඳහා හිඟ වාරික එකතු කිරීමට කටයුතු කිරීම මඟින් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට සමාජ ආරක්ෂණය සැලසීම.

6. වෘත්තීය පුහුණු ආයතනවල සහ තරුණ කණ්ඩායම්වල ස්වයං රැකියා/ ව්‍යවසායකත්ව හැකියාවන් වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම තුළින් ස්වයං රැකියාවල යෙදෙන ලෙස තරුණයින් දිරිමත් කිරීම හා ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතා වැඩිදියුණු කිරීම.

7. සමාජ ආරක්ෂණය පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීම සඳහා ජන මාධ්‍ය මඟින් ප්‍රචාරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම මඟින් රජයේ විශ්‍රාම වැටුපක් නොලබන පුද්ගලයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම හා එහි ප්‍රතිලාභ පිළිබඳව දැනුවත් කර ස්වයං රැකියා/ ව්‍යවසායකත්වය සඳහා පෙළඹවීම.

8. සමාජ ආරක්ෂණය පිළිබඳව දැනුම ප්‍රවර්ධනය තුළින් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සහ අනෙකුත් තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම.

9. 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ පනත කාලීන අවශ්‍යතාවයට අනුව සංශෝධනය කිරීම මඟින් සමාජ ආරක්ෂණ වැඩසටහන් වඩාත් පුළුල් පරාසයකට ව්‍යාප්ත කිරීම.

10. කාලීන අවශ්‍යතාවය අනුව නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම හඳුන්වා දීම තුළින් සියලුම ජනතාව වෙත සමාජ ආරක්ෂණය සැලසීම.

11. සමාජ ආරක්ෂණය පිළිබඳව දැනුම ප්‍රවර්ධනය තුළින් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන් සහ අනෙකුත් තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම- සමාජ ආරක්ෂණය සහ සමාජ රැකවරණය සම්බන්ධ උසස් අධ්‍යාපන සහතිකපත්‍ර පාඨමාලාවක් ආරම්භ කිරීම.

# 13.කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය

## 13.1. 2024 වර්ෂයේ විශේෂ අවස්ථා සහ කළමනාකරණ විශ්ලේෂණය

**01. මුල් ළමාවිය සංවර්ධන සතියට සමගාමීව පැවැත්වූ උපදේශන හා විදේශ ආධාර මත විශ්‍රාම වැටුප් ඔප්පු ලබා දීමේ වැඩසටහන**
(2024.07.18 - බප/ජය ගොතටුව මහා විද්‍යාලය)

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කෙරෙන “2024 - ජාතික මට්ටමේ උත්සව හා විශේෂ වැඩසටහන් මාලාව” යටතේ මුල් ළමාවිය සංවර්ධන සතියට සමගාමීව, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය විසින් පාසල් ශිෂ්‍ය ප්‍රජාව හා දෙමව්පියන් වෙත සමාජ ආරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ හා කොරියානු ජාතික පරිත්‍යාගශිලීන්ගේ දායකත්වය යටතේ සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ඔප්පු ලබාදීමේ වැඩසටහන 2024 ජූලි මස 18 දින, බප/ජය ගොතටුව මහා විද්‍යාල පරිශ්‍රයේදී පවත්වන ලදී.

වැඩසටහන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ) කල්හාරි ද සිල්වා මහත්මිය ඇතුලු මණ්ඩලයේ නිලධාරීන්, බප/ජය ගොතටුව මහා විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති (අධ්‍යාපන සංවර්ධන) ශිරෝමි ශ්‍රී පත්මකුමාර මහත්මිය ඇතුලු ගුරු හා සිසු දරුදැරියන් සහ දෙමාපියන්ගේ සහභාගිත්වයෙන් පැවති අතර සම්පත් දයකත්වය අමාත්‍යාංශ උපදේශන අංශයේ ආචාර්ය සුසන්ත බණ්ඩාර මහතා විසින් සපයන ලදී.





**02. සමාජ ආරක්ෂණයට කැප වූ උතුරු හා නැගෙනහිර පළාත් රාජ්‍ය නිලධාරීන් අගයයි**
**(2024.08.15 – Northway Hotel පරිශ්‍රය)**

රාජ්‍ය විශ්‍රාම වැටුපකට හිමිකම් නොකියන සේවා නියුක්තිකයින් ඉලක්කකර ක්‍රියාත්මක සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් හා ප්‍රතිලාභ ක්‍රමය, උතුරු හා නැගෙනහිර පළාත් තුළ ව්‍යාප්තියට ඉහළ දායකත්වයක් දැක්වූ රාජ්‍ය නිලධාරීන් ඇගයීමේ “සමාජ ආරක්ෂණ සම්මාන උළෙල - 2024” උත්සවය, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ගරු සභාපති වරලත් ඉංජිනේරු පි.එස්.එස්. දික්වැල්ල මහතාගේ ප්‍රධානත්වයෙන් 2024.08.15 වන දින වවුනියාව, නොර්ත්වේ හෝටල් උත්සවශාලාවේදී පැවැත්විය.

මෙහිදී උතුරු හා නැගෙනහිර පළාත් තුළ ජනතාව වෙත සමාජ ආරක්ෂණ හිමිකම් ලබාදීම වෙනුවෙන් කැපවීමෙන් කටයුතු කළ දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරුන්, සමාජ ආරක්ෂණ මණ්ඩලයේ දිස්ත්‍රික් නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, ආර්ථික සංවර්ධන නිලධාරින්, සමාජ සේවා නිලධාරීන් සහ පරිපාලන ග්‍රාම නිලධාරීන් ඇතුළු රාජ්‍ය නිලධාරීන් ඇගයීමට ලක්විය.

මෙම අවස්ථාවට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි කේ.ඒ.එස්.ප්‍රසන්න කළුආරච්චි මහතා, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ) කල්හාරි ද සිල්වා මහත්මිය ඇතුළු උතුරු හා නැගෙනහිර පළාත් තුළ දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ රාජ්‍ය නිලධාරීන් රැසක් සම්බන්ධ විය.







**03. 3rd International Conference of Social Work (ICOSW) 2024 වැඩසටහන සඳහා සම්පත් දායකයෙකු ලෙස සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය ඉදිරිපත් කිරීම.**

“සැමට සමාජ ආරක්ෂාව සාක්ෂාත් කර ගැනීම සඳහා විවිධ ප්‍රතිපත්ති සහ වැඩසටහන් ගවේෂණය කිරීම” යන තේමාව සාක්ෂාත් කරගැනීමේ අරමුණින්, ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් සංවිධානය කරනු ලැබූ 3rd International Conference of Social Work (ICOSW) 2024 වැඩසටහන

මෙම වැඩසටහන සඳහා සමාජ ආරක්ෂණ විෂය පිළිබඳ විශේෂ දේශනය පැවැත්වීම අප මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී කේ.ඒ.එස්.ප්‍රසන්න කළුආරච්චි මහතා විසින් සිදු කරනු ලදී.





**04. තරුණ ප්‍රජාව ස්වයං රැකියා සඳහා යොමු වීම දිරිමත් කිරීම සහ ඔවුන් වෙත සමාජ ආරක්ෂණ රැකවරණය හඳුන්වාදීමේ වැඩසටහන**
**(2024.09.26 හා 27 - පාදුක්ක, පහත්ගම, හොන්නන්තර හා රාජගිරිය ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පුහුණු මධ්‍යස්ථාන)**

තරුණ ප්‍රජාව ස්වයං රැකියා සඳහා යොමු වීම දිරිමත් කිරීම, ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වාදීම සඳහා වූ වැඩසටහන් මාලාවක් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරී පුහුණු මධ්‍යස්ථාන කේන්ද්‍ර කරගනිමින් පවත්වන ලදී. මෙම වැඩසටහන් මාලාවේ, වැඩසටහනක් 04 ක් 2024 වර්ෂයේ සැප්තැම්බර් මස 26 හා 27 යන දෙදින තුළ, ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ පාදුක්ක, පහත්ගම, හොන්නන්තර හා රාජගිරිය යන පුහුණු මධ්‍යස්ථානයන් හී පවත්වන ලදී.

මෙම වැඩසටහන් ප්‍රවීණදේශක උදාන ලිවේරා මහතාගේ සම්පත් දායකත්වයෙන් සහ සමාජ ආරක්ෂණ නිලධාරී (ප්‍රවර්ධන) ඩී. එස් ලක්මාල් මහතාගේ මෙහෙයවීමෙන් සිදුකරන ලදී.






### 05. Best Annual Report and Accounts Awards for Public Sector – 2023
### (2024.12.02 BMICH ආයතන පරිශ්‍රය)

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ රාජ්‍ය මූල්‍ය ගණකාධිවරුන්ගේ සංගමය එක්ව පවත්වන ලද Best Annual Report and Accounts Awards for Public Sector – 2023 තරඟය සඳහා ඉදිරිපත් වූ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, ශ්‍රී ලංකාවේ සියළුම රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරී සඳහා වන කාණ්ඩයේ දෙවන (02) ස්ථානය වන රිදී සම්මානය (Silver Award) දිනා ගැනීමට විය.






### 06.නව සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම හා ඉදිරි සැලැස්ම සකස් කිරීම.
### (2024.12.04 CIPM ආයතන පරිශ්‍රය)

අප මණ්ඩලයේ සභාපති එම්.කේ.බී දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ඉදිරි සැලැස්ම පිළිබඳව ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීම සඳහා අප මණ්ඩලයේ සියළුම අංශයන්හි නිලධාරීන් ආවරණයවන පරිදි, නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් 2024.12.04 වන දින නාරාහේන්පිට CIPM ආයතන පරිශයේ දී වැඩමුළුවක් පවත්වන ලදී.









## 13.2.මුළු බඳවා ගැනීම් එකතුව පදනම්ව ඉහළම ප්‍රගතිය වාර්තාකළ සම්බන්ධීකරණ නිලධාරීන් - 2024



1. ටී.සංකර් මයා
සම්බන්ධීකරණ නිලධාරී - යාපනය
සාමාජික සංඛ්‍යාව - 7,315
මූල්‍යම වටිනාකම - රු. 54,819,385.00



2. එස්.ටී.සුදාකරන් මයා
සම්බන්ධීකරණ නිලධාරී - අම්පාර
සාමාජික සංඛ්‍යාව - 3,886
මූල්‍යම වටිනාකම -රු. 4,898,655.00



3. ඒ.එම්.අමීන් මයා
සම්බන්ධීකරණ නිලධාරී - මඩකලපුව
සාමාජික සංඛ්‍යාව - 3,859
මූල්‍යම වටිනාකම - රු. 5,132,164 .00



4. එම්.වී.ඒ.තිලිණ හසංක මයා
සම්බන්ධීකරණ නිලධාරී - බදුල්ල
සාමාජික සංඛ්‍යාව - 3,805
මූල්‍යම වටිනාකම - රු. 5,842,060.00



5. කේ.සංජීවන් මයා
සම්බන්ධීකරණ නිලධාරී - මුලතිව්
සාමාජික සංඛ්‍යාව - 2,558
මූල්‍යම වටිනාකම -රු. 3,473,867.00



6. සශිකලා මධුෂානි මිය
සම්බන්ධීකරණ නිලධාරී - කෑගල්ල
සාමාජික සංඛ්‍යාව - 2,463
මූල්‍යම වටිනාකම - රු. 1,578,975.00



7. එච්.කේ.දුලක්ෂි රුවාෂා චන්ද්‍රසේන මිය
සම්බන්ධීකරණ නිලධාරී - බදුල්ල
සාමාජික සංඛ්‍යාව - 2,377
මූල්‍යම වටිනාකම -රු. 4,987,632.00



8. එච්.එම්.පී.බණ්ඩාර මයා
සම්බන්ධීකරණ නිලධාරී - කුරුණෑගල
සාමාජික සංඛ්‍යාව - 2,297
මූල්‍යම වටිනාකම -රු. 5,382,394.00



9. බී.ජී.අමිල ගමගේ මයා
සම්බන්ධීකරණ නිලධාරී - මාතර
සාමාජික සංඛ්‍යාව - 2,158
මූල්‍යම වටිනාකම - රු. 2,673,988.00



10. රසික සංජීලා මිය
සම්බන්ධීකරණ නිලධාරී - මහනුවර
සාමාජික සංඛ්‍යාව - 2,100
මූල්‍යම වටිනාකම - රු.3,526,272.00

## 13.3. පළමු වාරික මුදල් රැස්කිරීම්හි එකතුව පදනම්ව ඉහළම ප්‍රගතිය වාර්තාකළ සම්බන්ධීකරණ නිලධාරීන් 2024



1. ටී.සංකර් මයා
සම්බන්ධීකරණ නිලධාරී - යාපනය
මුල්‍යම වටිනාකම - රු. 54,819,385.00
සාමාජික සංඛ්‍යාව - 7,315



2. එම්.වී.ඒ.තිලිණ හසංක මයා
සම්බන්ධීකරණ නිලධාරී - බදුල්ල
මුල්‍යම වටිනාකම -රු. 5,842,060.00
සාමාජික සංඛ්‍යාව - 3,805



3. එච්.එම්.පී.බණ්ඩාර මයා
සම්බන්ධීකරණ නිලධාරී - කුරුණෑගල
මුල්‍යම වටිනාකම -රු. 5,382,394.00
සාමාජික සංඛ්‍යාව - 2,297



4. ඒ.එම්.අමීන් මයා
සම්බන්ධීකරණ නිලධාරී - මඩකලපුව
මුල්‍යම වටිනාකම - රු. 5,132,164.00
සාමාජික සංඛ්‍යාව - 3,859



5. බී.සගීගා මෙය
සම්බන්ධීකරණ නිලධාරී - ත්‍රිකුණාමලය
මුල්‍යම වටිනාකම -රු. 4,999,575.00
සාමාජික සංඛ්‍යාව - 1,990



6. එච්.කේ.දුලක්ෂි රුවාෂා චන්ද්‍රසේන මිය
සම්බන්ධීකරණ නිලධාරී - බදුල්ල
මුල්‍යම වටිනාකම - රු. 4,987,632.00
සාමාජික සංඛ්‍යාව - 2,377



7. එස්.ටී.සුදාකරන් මයා
සම්බන්ධීකරණ නිලධාරී - අම්පාර
මුල්‍යම වටිනාකම -රු. 4,898,655.00
සාමාජික සංඛ්‍යාව - 3,886



8. නිලන්ති ඒකනායක මිය
සම්බන්ධීකරණ නිලධාරී - ගම්පහ
මුල්‍යම වටිනාකම -රු. 4,686,222.00
සාමාජික සංඛ්‍යාව - 664



9.වයි.එම්.ඉනිගෝ මයා
සම්බන්ධීකරණ නිලධාරී - මඩකලපුව
මුල්‍යම වටිනාකම - රු. 3,544,510.00
සාමාජික සංඛ්‍යාව - 1,771



10. රසික සංජීලා මිය
සම්බන්ධීකරණ නිලධාරී - මහනුවර
මුල්‍යම වටිනාකම - රු. 3,526,272.00
සාමාජික සංඛ්‍යාව - 2,100

**13.4. අනුමත කාර්යය මණ්ඩලය හා පුරප්පාඩු**

2024.12.31 දින වන විට ආයතනයේ නිලධාරීන් 150ක් සේවයේ නියුතු අතර, පුරප්පාඩු 48 ක් පවතී.

**13.5. අනුමත කාර්යය මණ්ඩලය වැඩි කිරීම හා පුරප්පාඩු පිරවීම**

2024.12.31 වන විට තනතුරු පුරප්පාඩු 48 ක් පවතින අතර, එම තතනතුරු සඳහා බඳවාගැනීමට රේඛීය අමාත්‍යාංශය වෙත අංක 2/1/147 – 50 දරණ 2024.07.15 දිනැති ලිපිය මගින් ඉල්ලීම් කර ඇති අතර, අදාළ පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීමට රාජ්‍ය සේවයේ බඳවාගැනීම් කමිටුව වෙත යොමු කිරීමේ ආකෘතිය අනුව සම්පූර්ණ කර අංක 2/1/147 – 54 දරණ 2024.11.18 දිනැති ලිපිය මගින් යලි පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවාගැනීමට අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව, රේඛිය අමාත්‍යාංශය වෙතින් අංක MRDSS&CE/ADM/12/SSB/29 දරණ 2024.12.04 දරණ ලිපිය මගින් රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල නිලධාරී කමිටුව වෙත යොමු කර ඇත. පුරප්පාඩු පැවැති තනතුරු 09 ක් සඳහා නව බඳවාගැනීමට සිදු කිරීමට ලැබු අනුමැතිය මත 2024 වර්ෂයේ නව නිලධාරීන් බඳවාගැනීමට කටයුතු කර ඇත.

එසේම, තනතුරු පුරප්පාඩු සඳහා පවතින සේවා අවශ්‍යතාවය මත සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කර ගැනීම සඳහා වන ඉල්ලීම අංක 2/1/147 – 52 දරණ 2024.09.12 වන දින රේඛීය අමාත්‍යාංශ ලේකම් මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කර ඇත.

**කාර්යය මණ්ඩල විශ්ලේෂණය - 2024 වර්ෂය (2024.12.31 දිනට)**

| අනු අංකය | තනතුරු නාමය | අනුමත | දැනට සිටින | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1 | සාමාන්‍යාධිකාරි | 1 | 1 | 0 |
| 2 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුල්‍ය) | 1 | 1 | 0 |
| 3 | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සමාජ ආරක්ෂණ) | 1 | 1 | 0 |
| 4 | සහකාර සාමාන්‍යාධිකාරි (මුල්‍ය) | 1 | 0 | 1 |
| 5 | සහකාර සාමාන්‍යාධිකාරි (බඳවා ගැනීම් හා දිස්ත්‍රික් පරිපාලන) | 1 | 1 | 0 |
| 6 | සහකාර සාමාන්‍යාධිකාරි (පාලන) | 1 | 0 | 1 |
| 7 | සහකාර සාමාන්‍යාධිකාරි (විශ්‍රාම වැටුප්/රක්ෂණ) | 1 | 1 | 0 |
| 8 | අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| 9 | සමාජ ආරක්ෂණ නිලධාරි (පාලන) | 1 | 0 | 1 |
| 10 | කළමණාකරු (ඔප්පු සේවා ) | 1 | 1 | 0 |
| 11 | සමාජ ආරක්ෂණ නිලධාරි (රක්ෂණ) | 1 | 0 | 1 |
| 12 | ගිණුම් නිලධාරි (මුල්‍ය) | 1 | 1 | 0 |
| 13 | සමාජ ආරක්ෂණ නිලධාරි (ප්‍රවර්ධන) | 1 | 1 | 0 |
| 14 | සමාජ ආරක්ෂණ නිලධාරි (විශ්‍රාම වැටුප්) | 1 | 1 | 0 |
| 15 | සමාජ ආරක්ෂණ නිලධාරි (තොරතුරු තාක්ෂණ) | 1 | 1 | 0 |
| 16 | ගිණුම් නිලධාරි (රැස්කිරීම්) | 1 | 0 | 0 |
| 17 | ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරි | 6 | 5 | 1 |
| 18 | විගණන නිලධාරින් | 2 | 1 | 1 |
| 19 | සම්බන්ධීකරණ නිලධාරින් | 49 | 31 | 18 |
| 20 | විමර්ශන නිලධාරීන් | 2 | 2 | 0 |
| 21 | දත්ත පරිපාලක | 1 | 0 | 1 |
| 22 | පරිගණක ජාල සහකරු | 1 | 1 | 0 |
| 23 | පරිගණක වැඩසටහන් සහකාර (මෘදුකාංග) | 1 | 1 | 0 |
| 24 | පරිගණක වැඩසටහන් සහකාර (දෘඩාංග) | 1 | 1 | 0 |
| 25 | පොත් තබන්නා | 2 | 1 | 1 |
| 26 | කළමනාකරණ සහකාර | 74 | 54 | 20 |
| 27 | රියදුරු | 9 | 6 | 3 |
| 28 | කාර්යාල කාර්ය සහායක | 34 | 33 | 1 |
| එකතුව | | **198** | **150** | **48** |

**ස්ථානය අනුව කාර්යය මණ්ඩලය**

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සේවකයින් 150න් 77 ක් ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව සේවය කරන අතර, සේවකයින් 73 ක් සමාජ ආරක්ෂණ මණ්ඩල දිස්ත්‍රික් කාර්යාලයන්හි විහිදී සිටී.

ප්‍රධාන කාර්යාලය - 77
<u>දිස්ත්‍රික් කාර්යාල - 73</u>
**එකතුව - <u>150</u>**

## 13.6. 2024 වර්ෂයේ අස්වීම් හා විශ්‍රාම යාම්

| අනු අංකය | තනතුර | නම | අස්වීම් හා විශ්‍රාම යාම් දිනය | විස්තරය |
|---|---|---|---|---|
| 1 | කළමනාකරු (රක්ෂණ) | ඩබ්.එස්.එම්.ගුණතිලක මෙය | 2024.01.01 | සේවය අතහැර යාම |
| 2 | සම්බන්ධීකරණ නිලධාරී | කේ.නිතර්සන් මයා | 2024.01.26 | සේවය අතහැර යාම |
| 3 | සම්බන්ධීකරණ නිලධාරී | ඩබ්.කේ.එම්.ජී.වීරසිංහ මිය | 2024.03.01 | ඉල්ලා අස්වීම |
| 4 | කාර්යාල කාර්ය සහායක | බී.එච්.ඩී.රණසිංහ මයා | 2024.06.10 | සේවය අතහැර යාම |
| 5 | කළමනාකරු (පාලන) | එම්.කේ.දයානි පුෂ්පලතා මිය | 2024.07.01 | උසස්වීම |
| 6 | සම්බන්ධීකරණ නිලධාරී | ඒ.ආර්.එම්.අස්ලම් මයා | 2024.07.08 | ඉල්ලා අස්වීම |
| 7 | සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) | ඩබ්.එස්.ප්‍රියදර්ශනී මිය | 2024.08.12 | ඉල්ලා අස්වීම |
| 8 | සම්බන්ධීකරණ නිලධාරී | සූරියකාන්ත් මයා | 2024.08.26 | ඉල්ලා අස්වීම |
| 9 | රියදුරු | කේ.එම්.බුද්ධදාස මයා | 2024.10.03 | ඉල්ලා අස්වීම |

## 13.7.පුහුණුව හා සංවර්ධනය

| අනු අංකය | | පාඨමාලාවේ නම | පැවැත් වූ දිනය | සම්පත් දායකත්වය | පැවැත්වූ ස්ථානය | වැය වූ මුදල (රු.) |
|---|---|---|---|---|---|---|
| 01. | 1 වන කාර්තුව | 2023 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන සකස්කිරිම සම්බන්ධ එක්දින පුහුණු වැඩසටහන | 2024.01.11 | වරලත් ගණකාධිකාරී - සංජය බණ්ඩාර මහතා | CIPM ආයතනය ප්‍රාග් ආයතනය මඟින් සංවිධානය කරන ලද | **13,500.00** |
| 02. | 2 වන කාර්තුව | ආකල්ප හා මානසික සමබරතාවය පිළිබඳ සමූහ පුහුණු පාඨමාලාව | 2024.07.09 | ඉරෝෂ් ජයසේකර මහතා<br>ශ්‍රී ලංකා සමාජ සංවර්ධන ආයතනය- පුහුණු නිලධාරී | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය- ප්‍රධාන කාර්යාලය | දේශක ගාස්තු = 2700.00<br>සංග්‍රහ වියදම් =12365.00<br>**15,065.00** |
| 03. | 3 වන කාර්තුව | පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ මූලික දැනුම වර්ධනය කිරීම | 2024.08.07 | ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරියේ උපදේශක (තොරතුරු තාක්ෂණ) කාංචන මහතා | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය- ප්‍රධාන කාර්යාලය | දේශක ගාස්තු = 2100.00<br>සංග්‍රහ වියදම් =10,440.00<br>**12,540.00** |
| 04. | 4 වන කාර්තුව | බැහැරගත පුහුණු වැඩසටහන | 2024.09.06 | උදයා දේවාමුල්ල මහතා | උස්වැටකෙයියාව නාවික හමුදාවට අයත් මාලිමා ක්ලබ් හවුස් ආයතනය | සංග්‍රහ වියදම් 54800.00<br>ප්‍රවාහන වියදම් 30000.00<br>දේශක ගාස්තු 40000.00<br>**124,800.00** |
| | | වැය වූ මුළු මුදල | | | | **165,905.00** |

## 2024 වර්ෂයේ විදේශීය පාඨමාලා සඳහා නිලධාරීන් සහභාගී වීම සම්බන්ධ විස්තර

| අනු අංකය | සහභාගී වූ රට | පාඨමාලාවේ නම | පැවැත් වූ දිනය | සහභාගී වූ නිලධාරීන් | සම්පත් දායකත්වය | ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මඟින් දීමනා ගෙවීම සඳහා වැය වූ මුදල (රු.) |
|---|---|---|---|---|---|---|
| 01. | චීනය | සංවර්ධනය වෙමින් පවතින රටවල සමාජ ආරක්ෂණය සහ දරිද්‍රතාවය අඩුකිරීම | 2024.05.23 දින සිට 2024.06.05 දක්වා | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සමාජ ආරක්ෂණ) - කල්හාරි ද සිල්වා මිය | මහජන චීන සමුහාණ්ඩුවේ තානාපති කාර්යාලයේ ආර්ථික හා වාණිජ කාර්යාලය | ➢ අනියම් දීමනාව = රු.110,595.00<br>➢ උණුසුම් දීමනාව = රු. 28015.50<br>එකතුව = රු. 138,610.50 |
| 02. | කොරියාව | 2024 KOICA ආරාධිත සහයෝගිතා පුහුණු වැඩසටහන | 2024.07.07 දින සිට 2024.07.20 දක්වා | සාමාන්‍යාධිකාරී - කේ.ඒ.එස්.පී.කළුආරච්චි මහතා | KOICA ආයතනය | ➢ අනියම් දීමනාව = රු.106,862.00<br>➢ උණුසුම් දීමනාව = රු. 29,058.75<br>➢ රාජකාරි විදේශ = රු. 10,000.00 ගමන් බලපත්‍රය සඳහා<br>එකතුව = රු.145,920.75 |
| | | වැය වූ මුළු මුදල | | | | **රු. 284,531.25** |

# 14. මණ්ඩලයේ කොට්ඨාශ / අංශ / ඒකකවල කාර්යයන්

## 14.1. පාලන අංශය

### 14.1.1.පාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

මණ්ඩලයේ දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ දී ආයතනික පරිපාලන කටයුතු හා පරිපාලන ව්‍යුහය ශක්තිමත්ව හා ඵලදායීව පවත්වාගෙන යාම පරිපාලන අංශය වෙත පැවරී තිබේ. ආයතනයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා සැලසුම්කරණය, සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙනු ලබන නියෝග ක්‍රියාත්මක කිරීම, රජය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛන ප්‍රකාරව කටයුතු කිරීම හා අනෙකුත් සේවා අංශයන්ගේ කටයුතු වඩාත් කාර්යක්ෂමව ඉටු කිරීමට අවශ්‍ය සහයෝගය පාලන අංශය විසින් ලබා දීමේ දී පහත සඳහන් මූලික කාර්යභාරයන් ඉටු කරනු ලැබේ.

1. අනුමත බඳවා ගැනීම් පරිපාටිය අනුව කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, පුහුණු කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම, වැටුප් වර්ධක ලබා දීම, වැටුප් වැඩිකිරීමේ පරිවර්තන සිදු කිරීම සහ සුදුසුකම් සැපිරීමෙන් පසු උසස් වීම් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
2. ආයතනයේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුද්ගලික ලිපිගොනු නිසිලෙස නඩත්තු කිරීම සහ අවශ්‍ය අවස්ථාවලදී විනය කටයුතු සිදු කිරීම.
3. ආයතනයේ ප්‍රවාහන කටයුතු, වාහන නඩත්තු කටයුතු, ආරක්ෂක සේවා, සනීපාරක්ෂක සේවා ලබා ගැනීමේ දී ගිවිසුම් ඇති කර ගැනීම.
4. වාර්ෂික වාර්තා, සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා අනෙකුත් මාසික, ත්‍රෛමාසික සියලු වාර්තා සකස් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු අමාත්‍යාංශය වෙත යොමු කිරීම.
5. දිවයින පුරා ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කටයුතු විධිමත් කර ගැනීම සඳහා අභ්‍යාසලාභි උපාධිධාරීන් 58000 ක් බඳවා ගැනීමේ රජයේ වැඩපිළිවෙල යටතේ බඳවා ගෙන ඇති උපාධිධාරීන් **249**ක් අප ආයතනය වෙත අනුයුක්ත කර ඇති අතර, ඔවුන්ගේ ලිපිගොනු ආශ්‍රිත කටයුතු සිදුකිරීම.
6. වර්ෂ අවසාන කාර්ය සාධන වාර්තාව සකස්කර අමාත්‍යාංශය වෙත යොමු කිරීම.
7. තාක්ෂණික උපදේශන කමිටුව සඳහා අවශ්‍ය පත්‍රිකා සකස්කර ඉදිරිපත් කිරීම හා රැස්වීම් පැවැත්වීමේ කටයුතු සංවිධානය කිරීම.
8. මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සංවිධානය කිරීම හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දෙන නියෝග ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
9. කාර්ය මණ්ඩලයේ දෛනික පැමිණීමේ වාර්තා ගොනු නඩත්තු කර ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල 25 මාස 06කට වරක් නිවාඩු වාර්තා සියළුම කර්යමණ්ඩලයට නිකුත් කිරීම සහ මාසිකව වාර්තා ගොනු කිරීම.
10. කාර්යමණ්ඩලයේ අග්‍රහාර රක්ෂණ අරමුදලේ සාමාජිකත්වය ලබා ගෙන ඇති අයගේ රක්ෂණ වාරික මුදල් පිළිබඳ වාර්තා සකස් කර මාසිකව රක්ෂණ භාර අරමුදලට යොමු කිරීම හා රක්ෂණ ආවරණ ඉල්ලීම් සඳහා කඩිනමින් මුදල් ලබාගැනීමේ අවශ්‍ය කටයුතු කිරීම.
11. දෛනිකව ආයතනයට ලැබෙන සියළුම ලිපි ලේඛණ පරික්ෂාකර බලා සභාපති, සාමාන්‍යාධිකාරි අදාළ අංශ ප්‍රධානීන් වෙත නොපමාව යොමු කිරීම මෙන්ම දිස්ත්‍රික් කාර්යාල හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත යොමු කළ යුතු ලිපි හා පාර්සල් කඩිනමින් තැපෑලට යොමු කිරීම.
12. කාර්යමණ්ඩලයේ මාරු මණ්ඩල රැස්වීම් පවත්වා ඒ අනුව ස්ථානමාරුවීම් සඳහා අවශ්‍ය ලිපි නිකුත් කිරීම හා ආයතනයේ රාජකාරි අවශ්‍යතාවය මත සිදුකරන ස්ථාන මැරුවීම් සඳහා කටයුතු කිරීම.

13. මාසිකව,ත්‍රෛයි මාසිකව හා වාර්ථා ,අභ්‍යන්තර විගණන විමසුම් හා රජයේ විගණන විමසුම් සඳහා පිළිතුරු යොමු කිරීම හා විගණන රැස්වීම් සඳහා සහභාගි වීම.
14. තාක්ෂණික කමිටු රැස්වීම් සඳහා සහභාගි වීම ,අවශ්‍ය තාක්ෂණික කමිටු පත්‍රිකා සකස් කිරීම හා රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සපයා දීම.
15. අත්‍යවශ්‍ය ආයතනික කටයුතු සඳහා අවශ්‍ය කැබිනට් පත්‍රිකා සකස් කිරීම හා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම.
16. කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.

### 14.1.2.පාලන අංශයේ සත්‍ය කාර්යය මණ්ඩලය

| තනතුර | නිලධාරි සංඛ්‍යාව |
|---|---|
| සාමාන්‍යාධිකාරී | 1 |
| සහකාර සාමාන්‍යාධිකාරි (පාලන) | 1 |
| සමාජ ආරක්ෂණ නිලධාරී (පාලන) | 0 |
| කළමනාකරණ සහකාර | 8 |
| සභාපතිතුමාගේ ලේකම් (සංවර්ධන නිලධාරී) | 1 |
| කාර්යාල කාර්ය සහයක | 2 |
| කාර්යාල කාර්ය සහයක (සභාපතිතුමාට අනුයුක්ත) | 1 |
| තැපැල් කටයුතු (කාර්යාල කාර්ය සහයක) | 1 |
| රියදුරු | 6 |

### 14.1.3. භෞතික සම්පත

ප්‍රධාන කාර්යාලය - 2013 මාර්තු මස 06 දින අංක 18, රාජගිරිය පාර, රාජගිරිය පිහිටි මහල් 04කින් යුත් මණ්ඩලයටම අයත් ගොඩනැගිල්ලක ස්ථාපිත කර ඇත.

දිස්ත්‍රික් කාර්යාල - දිවයින පුරා සියලු දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සමාජ ආරක්ෂණ දිස්ත්‍රික් කාර්යාල ස්ථාපනය කර ඇත.

### 14.1.4. සන්නිවේදන පහසුකම්

ආයතනය සඳහා ලබාගෙන තිබූ දුරකතන පද්ධතිය වැඩි දියුණුකර සෑම අංශයක්ම ආවරණය වන පරිදි නව ගොඩනැගිල්ලේ ස්ථාපනය කරන ලද අතර, ඒ සඳහා පොදු දුරකථන සම්බන්ධතා 03ක් ෆැක්ස් පහසුකම් ද සමඟ ස්ථාපනය කර ඇත. ඊට අමතරව පහත පරිදි සෘජු දුරකථන සම්බන්ධතා ලබා ගෙන ඇත.

සභාපති - සෘජු දුරකථන හා ෆැක්ස් අංක එකක්

සාමාන්‍යාධිකාරි - සෘජු දුරකථන හා ෆැක්ස් අංක එකක්

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි 02 - සෘජු දුරකථන හා ෆැක්ස් අංක දෙකක්

සහකාර සාමාන්‍යාධිකාරි 02 - දුරකථන දෙකක්

අභ්‍යන්තර විගණක - දුරකථන එකක්

රැස්කිරීම් අංශය විසින් තැපැල් කාර්යාල හා සම්බන්ධ වීමට - දුරකථන දෙකක් හා ඩයලොග් සිම්පත් දෙකක්

| | | |
|---|---|---|
| මනුසවි විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා | - | ඩයලොග් සිම්පත් එකක් |
| ක්ෂණික ඇමතුම් | - | දුරකථන එකක් |
| පොදු දුරකථන | - | දුරකථන දෙකක් |

ඉහත දුරකථන සම්බන්ධතාවලට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25ක් සඳහා ද දුරකථන පහසුකම් ලබා දී ඇත. ප්‍රධාන කාර්යාලයේ පරිගණක ජාලගත පද්ධතිය ස්ථාපිත කරන ලද අතර, VPN පද්ධතියක් හරහා දිස්ත්‍රික් කාර්යාල වෙත ජාලගත කරමින් සේවා කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමට පියවර ගෙන ඇත.

### 14.1.5. ප්‍රවාහන පහසුකම්

2024.12.31 දින වන විට කැබ් රථ 02 , කාර් රථ 02, වෑන් රථ 01, ත්‍රී රෝද රථ 01 හා යතුරු පැදි 14ක් ලෙස සියලුම වාහන 20ක් මණ්ඩලය සතුවේ.

එම වාහනවලින් කැබ්රථ 02 ක් 1997 හා 1998 යන වර්ෂවල මිලදී ගෙන ඇති අතර, කාර් රථය 2008 වර්ෂයේ දී ද, නිසාන් ජූක් කාර් රථය 2013 වර්ෂයේදී ද, බජාජ් වර්ගයේ ත්‍රී රෝද රථය 2013 වර්ෂයේදී ද, ටොයොටා හයිඒස් වෑන් රථය 2014 වර්ෂයේදී ද මිලදී ගෙන ඇත. එමෙන්ම බජාජ් වර්ගයේ යතුරු පැදි 09 ක් 2011 වර්ෂයේදී ද, අනිකුත් යතුරු පැදි 05 ක් 2014 වර්ෂයේදී මිලදී ගන්නා ලදී.

### 14.1.5.1. දැනට තිබෙන වාහනවල විස්තර (2024.12.31 දිනට)

| වාහන අංකය | වර්ගය | පළමුව ලියාපදිංචි කල දිනය | ඉතා හොඳයි | හොඳයි | අළුත්වැඩියා කර ධාවන තත්ත්වයේ පවතී | අබලන් | ගර්හිත |
|---|---|---|---|---|---|---|---|
| 250 - 6095 | කැබ් රථය | 1997.10.24 | | | √ | | |
| 252 - 5463 | ඩබල් කැබ් රථය | 1998.08.14 | | | √ | | |
| KH- 4506 | කාර් රථය | 2008.09.30 | | √ | | | |
| KX- 0914 | නිසාන් ජූක් කාර් රථය | 2013.10.17 | | √ | | | |
| NB - 8428 | ටොයොටා හයිඒස් වෑන් රථය | 2014.08.18 | √ | | | | |
| KB - 3112 | Toyota Corolla මෝටර් රථය | | √ | | | | |
| WP AAG - 9346 | බජාජ් වර්ගයේ ත්‍රී රෝද රථය | 2013.04.18 | | √ | | | |
| WP WK- 3810 | බජාජ් වර්ගයේ යතුරු පැදිය | 2011.04.06 | | √ | | | |
| WP WK- 3806 | බජාජ් වර්ගයේ යතුරු පැදිය | 2011.04.06 | | √ | | | |
| WP WK- 3789 | බජාජ් වර්ගයේ යතුරු පැදිය | 2011.04.06 | | √ | | | |
| WP WK- 3880 | බජාජ් වර්ගයේ යතුරු පැදිය | 2011.04.06 | | √ | | | |
| WP WK- 3815 | බජාජ් වර්ගයේ යතුරු පැදිය | 2011.04.06 | | | √ | | |
| WP WK- 3795 | බජාජ් වර්ගයේ යතුරු පැදිය | 2011.04.06 | | √ | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| WP WK-3801 | බජාජ් වර්ගයේ යතුරු පැදිය | 2011.04.06 | | √ | | | |
| WP WK-3882 | බජාජ් වර්ගයේ යතුරු පැදිය | 2011.04.06 | | √ | | | |
| WP WK-3787 | බජාජ් වර්ගයේ යතුරු පැදිය | 2011.04.06 | | √ | | | |
| WP BAR-3240 | බජාජ් වර්ගයේ යතුරු පැදිය | 2014.01.27 | | √ | | | |
| WP BAR-3263 | බජාජ් වර්ගයේ යතුරු පැදිය | 2014.01.27 | | √ | | | |
| WP BAR-3250 | බජාජ් වර්ගයේ යතුරු පැදිය | 2014.01.27 | | √ | | | |
| WP BAU-0765 | ස්කූටි වර්ගයේ යතුරු පැදිය | 2014.03.19 | | √ | | | |
| WP BAU-0769 | ස්කූටි වර්ගයේ යතුරු පැදිය | 2014.03.19 | | √ | | | |
| WP KJ 6856 | ජීප් රථය | 2011.06.13 | √ | | | | |
| WP CAK 5812 | Toyota – Axio මෝටර් රථය | | √ | | | | |

## 14.1.6. පාලන අංශයේ සීමාවන්

1. මේ වන විට තනතුරු පුරප්පාඩු 48 ක් පවතින අතර, එම තතනතුරු සඳහා බඳවාගැනීමට රේඛීය අමාත්‍යාංශය වෙත ලිපිය මගින් ඉල්ලීම් කර ඇති අතර, අදාළ පුරප්පාඩු තනතුරු සඳහා බඳවාගැනීමට රාජ්‍ය සේවයේ බඳවාගැනීම් කමිටුව වෙත ද අදාළ ආකෘතිය අනුව යලි පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවාගැනීමට අනුමැතිය ඉල්ලා ඇත. ඒ අනුව, රේඛීය අමාත්‍යාංශය වෙතින් අංක MRDSS&CE/ADM/12/SSB/29 දරණ 2024.12.04 දරණ ලිපිය මගින් රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත්කල නිලධාරී කමිටුව වෙත ද යොමු කර ඇති නමුත් අදාළ ආයතන මඟින් අප වෙත යහපත් ප්‍රතිචාරයක් තවම ලැබී නොමැති බැවින් ආයතනයේ අත්‍යවශ්‍ය බඳවාගැනීම් සිදුකිරීමට නොහැකි වී ඇත.

2. පවතින රථවාහන සංචිතය තුළ පැරණි වාහන අධික වීම හේතුවෙන් අළුත්වැඩියා වැය අධික වන නිසා නව වාහන මිල දී ගැනීමට කටයුතු කළ යුතු වේ.
3. දිස්ත්‍රික් කාර්යාල වෙත සේවා කටයුතු විමධ්‍යගත කිරීම සඳහා, භෞතික හා මානව සම්පත් අවශ්‍යතා සපුරාලීම.
4. ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ දැනට කාර්යය මණ්ඩලය සඳහා රැස්වීම් පැවැත්වීමට පහසුකම් නොමැති බැවින් ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට අවශ්‍යව කටයුතු සිදුකල යුතුව ඇත.

5. මෙම මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කර ඇති අතර, මෙහෙයුම් කටයුතු සිදුකිරීමේ දී නිලධාරින්ගේ ප්‍රවාහන රාජකාරි අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් වාහන නොමැති බැවින් ඒ සඳහා පහසුකම් ඇති කිරීම.
6. මණ්ඩලයේ සේවකයන්ගේ සුභසාධනය මෙන්ම රටේ පවතින ආර්ථිකමය තත්ත්වය හේතුවෙන් සහනදායී පොලී ණය ලබා ගැනීමේ ඇති හැකියාව අවම වීම හේතුවෙන් සේවක අතෘප්තිය ඇති වීම හා එසේ සේවකයන් සඳහා ණය ලබාදීම සඳහා මණ්ඩලය සතුව ප්‍රමාණවත් මුදල් සංචිත නොමැති වීම.

## 14.2. සමාජ ආරක්ෂණ අංශය

### 14.2.1. ප්‍රධාන කාර්යයන්

1. සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් හා ඉලක්කගත ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.
2. යෝජනාක්‍රමය පිළිබඳ දැනුවත් කිරීමෙන් පසුව සාමාජිකත්වය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
3. සාමාජිකයින් සඳහා අවශ්‍ය වන පාස්පොත්, වාරික මුදල් ගෙවීම සහ හිමිකම් ඔප්පු නිකුත් කිරීම.
4. ප්‍රධාන කාර්යාලයේ සමාජ ආරක්ෂණ අංශය හා දිස්ත්‍රික් කාර්යාල 25ක් පරිපාලනය කරමින් සේවා කටයුතු කාර්යක්ෂම කිරීමට පියවර ගැනීම.
5. ආයතන, නිලධාරීන් හා විවිධ සංවිධාන සම්බන්ධීකරණය කරමින් විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරිම.

### 14.2.2.ප්‍රතිලාභ ගෙවීම

1. සාමාජිකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ජීවිතාන්තය දක්වා අඛණ්ඩව මාසිකව විශ්‍රාම වැටුප ලබාදීම.
2. විශ්‍රාමිකයා වයස අවුරුදු 80 සම්පූර්ණ වීමට පෙර මියගියහොත් විශ්‍රාමිකයාට අවුරුදු 80 වනතෙක් කලත්‍රයට හෝ නම් කල පුද්ගලයෙකුට විශ්‍රාම වැටුප ලබාදීම.
3. සාමාජිකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර සිදුවන සාමාජිකයාගේ මරණය වෙනුවෙන් යැපෙන්නන් සඳහා ප්‍රතිලාභ ගෙවීම , අර්ධ අබලතා, පූර්ණ අබලතා ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කිරීම.
4. “ආරස්සාව” පූර්ව සැලසුම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ අතිරේක ප්‍රතිලාභ ගෙවීම.

### 14.2.3.සේවා ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාල

ඔප්පු සේවා, විශ්‍රාම වැටුප් හා රක්ෂණ වශයෙන් ප්‍රධාන කාර්යාලයේ සේවා ඒකක 03ක් සහ සියළුම දිස්ත්‍රික්කවල පිහිටුවා ඇති කාර්යාල 25 මගින් සේවා කටයුතු ඉටුකරනු ලබයි. දිස්ත්‍රික් කාර්යාල 25 කලාප 6කට බෙදා ජොෂ්ඨ සම්න්ධීකරණ නිලධාරීන් 06 දෙනෙකුගේ අධීක්ෂණය යටතේ කටයුතු කරනු ලැබේ.

### 14.2.4.යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධ වන නිලධාරීන්

දිස්ත්‍රික් කාර්යාල සඳහා සම්බන්ධීකරණ නිලධාරීන්, සහයක කාර්ය මණ්ඩල පත්කර ඇති අතර,ඔවුන් දිස්ත්‍රික් කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය හා සෘජු බඳවාගැනීම් කටයුතු සිදුකරනු ලබයි. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය මගින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් අනුයුක්ත කල සංවර්ධන නිලධාරීන් මඟින් ප්‍රදේශිය ලේකම් මට්ටමෙ සම්බන්ධීකරණ කටයුතු සිදුකරනු ලබයි. එමෙන්ම විවිධ අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු හා ආයතන සමඟ ඒකාබද්ධව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී එම නිලධාරීන්ගේ මැදිහත්වීම ලබා ගැනීමට කටයුතු කර ඇත.

### 14.2.5. සමාජ ආරක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය - 2024.12.31 දිනට

**ප්‍රධාන කාර්යාලයේ සත්‍ය කාර්යය මණ්ඩලය**

| තනතුර | | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| නි.සාමාන්‍යාධිකාරි (සමාජ ආරක්ෂණ) | - | 01 |
| ස.සාමාන්‍යාධිකාරි (බඳවාගැනීම් හා දිස්ත්‍රික් පරිපාලන) | - | 01 |
| ස.සාමාන්‍යාධිකාරි (විශ්‍රාම වැටුප්/රක්ෂණ) | - | 01 |
| **කළමනාකරුවන් / සම්බන්ධිකරණ නිලධාරින්** | | |
| කළමනාකරු (ඔප්පු සේවා) | - | 01 |
| කළමනාකරු (රක්ෂණ) | - | 00 |
| සමාජ ආරක්ෂණ නිලධාරි (විශ්‍රාම වැටුප්) | - | 01 |
| සම්බන්ධීකරණ නිලධාරින් | - | 01 |
| කළමනාකරණ සහකාර | - | 14 |
| කාර්යාල කාර්ය සහයක | - | 03 |
| **එකතුව** | | **23** |

**දිස්ත්‍රික් කාර්යාලයන්හි සත්‍ය කාර්යය මණ්ඩලය**

| තනතුර | | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී | - | 05 |
| සම්බන්ධීකරණ නිලධාරි | - | 30 |
| කළමනාකරණ සහකාර | - | 20 |
| කාර්යාල කාර්යය සහයක | - | 23 |
| **එකතුව** | | **78** |

### 14.2.6. සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

2024 වර්ෂයේ දී සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දිස්ත්‍රික් මට්ටමින් බඳවාගත් නව සාමාජිකයන් පිළිබඳ ප්‍රගතිය

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2024 වර්ෂයේ බඳවා ගැනීම් (සාමාජිකයින්) | අනු අංකය | දිස්ත්‍රික්කය | 2024 වර්ෂයේ බඳවා ගැනීම් (සාමාජිකයින්) |
|---|---|---|---|---|---|
| 01 | යාපනය | 7,315 | 14 | ගාල්ල | 1,202 |
| 02 | මඩකලපුව | 5,630 | 15 | කළුතර | 1,311 |
| 03 | බදුල්ල | 5,182 | 16 | මොනරාගල | 1,152 |
| 04 | මහනුවර | 4,595 | 17 | රත්නපුරය | 1,053 |
| 05 | කුරුණෑගල | 4,111 | 18 | පුත්තලම | 709 |
| 06 | අම්පාර | 3,886 | 19 | හම්බන්තොට | 627 |
| 07 | මාතර | 2,776 | 20 | ගම්පහ | 664 |
| 08 | කෑගල්ල | 2,624 | 21 | කොළඹ | 524 |
| 09 | නුවරඑළිය | 2,800 | 22 | මාතලේ | 497 |
| 10 | මුලතිව් | 2,563 | 23 | වව්නියාව | 442 |
| 11 | කිලිනොච්චිය | 2,187 | 24 | අනුරාධපුරය | 233 |
| 12 | ත්‍රිකුණාමලය | 1,990 | 25 | පොළොන්නරුව | 219 |
| 13 | මන්නාරම | 1,589 | 26 | සෘජු | 99 |
| **එකතුව** | | **47,248** | | **එකතුව** | **8,732** |
| **මුළු එකතුව 55,980** | | | | | |



**14.2.7.** නව සාමාජිකයින් බඳවාගැනීමේ හා වාරික රැස්කිරීමේ වාර්ෂික ප්‍රගතිය.

| අනු අංකය | වර්ෂය | නව බඳවාගැනීම් සංඛ්‍යාව | පළමු වාරික මුදල (රු.) (මිලියන) | වාර්ෂික වාරික රැස්කිරීම් (රු.) (මිලියන) |
|---|---|---|---|---|
| 01 | 2014 | 15,995 | 7.66 | 148.99 |
| 02 | 2015 | 21,599 | 13.79 | 146.38 |
| 03 | 2016 | 72,351 | 40.81 | 148.87 |
| 04 | 2017 | 63,141 | 36.84 | 170.96 |
| 05 | 2018 | 83,362 | 52.18 | 190.46 |
| 06 | 2019 | 38,543 | 37.26 | 198.04 |
| 07 | 2020 | 25,778 | 45.07 | 180.26 |
| 08 | 2021 | 57,803 | 126.33 | 177.57 |
| 09 | 2022 | 56,764 | 114.60 | 223.68 |
| 10 | 2023 | 66,448 | 145.25 | 246.99 |
| 11 | 2024 | 55,980 | 167.41 | 261.77 |



### 14.2.8. 2024 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම

| විස්තරය | සංඛ්‍යාව | වියදම (රු.) |
|---|---|---|
| විශ්‍රාම වැටුප් ගෙවීම් | 36,210 | 426,410,069.00 |
| මරණ පාරිතෝෂික ගෙවීම් | 39 | 533,000.00 |
| ආබාධිත පාරිතෝෂික ගෙවීම් | 24 | 627,972.00 |
| අතිරේක ප්‍රතිලාභ<br>(5 වසර ශිෂ්‍යත්වය, අ.පො.ස: සා/පෙ, අ.පො.ස: උ/පෙ) | 741 | 8,926,000.00 |
| **එකතුව** | **37,014** | **436,497,041.00** |

| **ශුද්ධ දායක මුදල් ආපසු ගෙවීම්** | **සංඛ්‍යාව** | **මුදල (රු.)** |
|---|---|---|
| | 567 | **25,203,731.00** |

### 14.2.9. 2024 වර්ෂයේ දායකයින්ගේ අය කළ මුදල්

| බඳවාගැනිමේ මුල් වාරික රැස්කිරිම් | ලැබීම් (රු.) |
|---|---|
| බඳවාගැනිමේ මුල් වාරික මුදල | **167,419,023.36** |

### 14.2.10. 2024 වර්ෂයේ පවත්වන ලද පුහුණු හා ජංගම දැනුවත් කිරිමේ වැඩසටහන

| | සංඛ්‍යාව |
|---|---|
| විශ්‍රම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රවර්ධන වැඩසටහන් | 3,314 |

### 14.2.11. සමාජ ආරක්ෂණ අංශයේ සීමාවන්

1. පුහුණුව ලත් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සේවයෙන් ඉවත්වීම බහුලව පැවතීම හේතුවෙන් සේවක පිරිවැටුම ඉහළ අගයක් ගෙන ඇති අතර, පුරප්පාඩු තනතුරු සඳහා නව බඳවා ගැනීම් අත්හිටුවා තිබීම හේතුවෙන් ප්‍රගතියට බලපෑම් සිදුවී ඇත. යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය කරනු බලබයි. සම්බනධීකරණ නිලධාරී පුරප්පාඩු තනතුරු 18ක් පවතී.

2. පරිගණක පද්ධතිය නිසිපරිදි ක්‍රියාත්මක නොවීම කාර්යක්ෂම සේවයක් ලබාදීම කෙරෙහි අහිතකර ලෙස බලපෑම් ඇතිකරන ලදී.

3. සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය හා ප්‍රචාරණ වියදම් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම වර්ෂයේ ප්‍රගතියට ඍණාත්මකව බලපාන ලදී.
4. රටේ පවතින අර්බුධකාරී ආර්ථිකමය තත්වයන් හේතුවෙන් විශ්‍රාම සැලසුම් වැනි ආයෝජනයන් සඳහා දක්වන උනන්දුව ක්‍රමයෙන් අඩුවීම.
5. ප්‍රාදේශීය ලේකම් කාර්යවලට අනියුක්ත කර ඇති සංවර්ධන නිලධාරීන්ගේ ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය,කාර්යාල උපකරණ ඉල්ලීම් ඉටුකිරීම ඉතා අවම මට්ටමකින් පමණක් සිදුකිරීමට හැකිවීම

## 14.3. මුදල් අංශය

### 14.3.1. ප්‍රධාන කාර්යයන්

- වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම.
- වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම.
- මාසික අක්මුදල් වාර්තා පිළියල කිරීම (වාර්ෂික අයවැය ප්‍රසම්පාදන මත)
- 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන වලට අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා නියමිත වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- මහා භාණ්ඩාගාරයට, රේඛීය අමාත්‍යාංශයට හා කළමනාකරණ කාර්යයන් සඳහා අවශ්‍ය වන මූල්‍ය වාර්තාවන් වරින් වර පිළියෙල කිරීම.
- මුදල් අංශයට අදාල සියලුම ගිණුම් යාවත්කාලීන කිරීම.
- සියලුම ගණුදෙනු වලට අදාළ බැංකු ගිණුම් ක්‍රමානුකූලව පවත්වා ගෙන යාම සහ මාසික බැංකු සැසඳුම් වාර්තා පිළියෙල කිරීම.
- මාසික විශ්‍රාම වැටුප් සහ අනෙකුත් සියලුම දායක ගෙවීම් සිදුකිරීම සහ ගිණුම්ගත කිරීම.
- දායකයින්ගෙන් ලබාගන්නා මුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීම.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදු කිරීම තුළින් ආයතනය සතු ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාවන් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම.
- කාර්යය මණ්ඩලය සඳහා මාසිකව වැටුප් සැකසීම හා අදාළ වාර්තාවන් පිළියෙල කිරීම.
- කළමනාකරණයට අවශ්‍ය තීරණ ගැනීම සඳහා විධිමත් හා නිවැරදි තොරතුරු ලබාදීම.
- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ සාමාජික මුදල් තැන්පතු භාර ගැනීම හා බැංකුගත කිරීම.
- මණ්ඩලය අවශ්‍ය සියලුම භාණ්ඩ හා සේවාවන් සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම.
- බැංකු සහ තැපැල් කාර්යාල මඟින් ලද දායක මුදල් මත දායක ගිණුම් යාවත්කාලීන කිරීම.
- වාර්ෂිකව සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමට අදාළ කටයුතු සිදු කිරීම.
- බඳවාගැනීම් සහ දායක මුදල් රැස්කිරීම් මත දිරිදීමනා ගණනය කිරීම සහ අදාළ ගෙවීම් සිදුකිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ආයතනයේ පුනරාවර්තන වියදම් සඳහා අවශ්‍ය සියලුම ගෙවීම් කටයුතු කළමනාකරණය කිරීම.
- ආයතනයේ භාණ්ඩ තොග පවත්වාගෙන යාම.
- ආයතනයේ අක්‍රිය දායකයින් සක්‍රිය කිරීමට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ආයතනයේ කාර්යමණ්ඩලය ලබාගන්නා ණය මුදල් පිළිබඳ ගිණුම් පවත්වාගෙන යාම.
- කලාකරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ ගිණුම් පවත්වාගැනීම හා කලාකරුවන්ට අදාළ ස්ථාවර තැන්පතු ගිණුම් විවෘත කිරීම.

### 14.3.2.මුදල් අංශයේ සත්‍ය කාර්යය මණ්ඩලය - 2024.12.31 දිනට

| තනතුර | | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) | - | 01 |
| සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්) | - | 0 |
| ගිණුම් නිලධාරි (මුදල්) | - | 01 |
| ගිණුම් නිලධාරි (රැස්කිරීම්) | - | 01 |
| පොත් තබන්නා | - | 01 |
| කළමනාකරණ සහකාර | - | 11 |
| කාර්යාල කාර්ය සහයක | - | 02 |
| **එකතුව** | - | **17** |

### 14.3.3.ආයතනය සතු වත්කම්

| අනු අංකය | විස්තරය | 2024.12.31 දිනට වටිනාකම (රු.) |
|---|---|---|
| 01 | ගොඩනැගිලි | 74,371,978.00 |
| 02 | ඉඩම් | 97,050,000.00 |
| 03 | මෝටර් රථ | 28,391,562.00 |
| 04 | කාර්යාල උපකරණ | 7,560,004.00 |
| 05 | පරිගණක | 8,653,088.00 |
| 06 | සන්නිවේදන උපකරණ | - |
| 07 | පරිගණක මෘදුකාංග | - |
| 08 | වෙනත් | - |
| 09 | යන්ත්‍ර උපකරණ හා කාර්යාල උපකරණ | 437,929.00 |
| | එකතුව | **216,464,561.00** |

### 14.3.4. 2024 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන

**පුනරාවර්තන**

| භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන (2024) (රු.) | වියදම (රු.) |
|---|---|
| 153,201,811.00 | **156,156,788.00** |

**ප්‍රාග්ධන**

| භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන (2024) (රු.) | වියදම (රු.) |
|---|---|
| **5,000,000.00** | 4,990,000.00 |

### 14.3.5.වෙනත් ළඟා කර ගැනීම්

සියලු චෙක්පත් ලිවීම් ගිණුම් සැකසීමේ කාර්යයන් හා වැටුප් සැකසීම් පරිගණක ගතකර ඇත.

වාර්ෂිකව රුපියල් මිලියන 407 ක් පමණ දායකයින් වෙත විශ්‍රාම වැටුප් ගෙවනු ලබන අතර දිවයින පුරා පිහිටි සමුපකාර ග්‍රාමීය බැංකු 2000ක් තුළින් විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කෙරේ.

දැනට දිවයින පුරා පිහිටි මහජන බැංකු, ලංකා බැංකු , ජාතික ඉතිරිකිරීමේ බැංකු, ප්‍රාදේශිය සංවර්ධන බැංකුව තුළින් හා තැපැල් කාර්යාල මඟින් දායකයින්ගේ මුදල් එකතුවීම සිදුවේ. විදේශ රටවල සේවා නියුක්තිකයන් වෙනුවෙන් නේවාසික විදේශ මුදල් ගිණුමක් ද (RFC) මහජන බැංකුවේ ආරම්භ කර ඒ හරහා ද දායකයින්ගේ වාරික මුදල් එකතු කිරීම සිදු කෙරේ.

## 14.4.අභ්‍යන්තර විගණන අංශය

### 14.4.1. ප්‍රධාන කාර්යයන්

- අනුමත සේවක සංඛ්‍යාව ,කාර්යය මණ්ඩල බඳවා ගැනීම් සහ පුද්ගලික ලිපිගොනු පරීක්ෂාව
- කාර්යය මණ්ඩල පැමිණීම පිටවීම සහ නිවාඩු පරීක්ෂාව
- කාර්යමණ්ඩල පුහුණු සහ සංවර්ධන ක්‍රියාමාර්ග පරීක්ෂාව
- වාහන ධාවනය සහ නඩත්තු කටයුතු පරීක්ෂාව
- නඩත්තු කටයුතු හා සනීපාරක්ෂක සහ ආරක්ෂක සේවා කටයුතු පරීක්ෂාව
- භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම් සහ දායක වාරික මුදල් ලැබීම් පරීක්ෂාව
- ප්‍රසම්පාදන කටයුතු පරීක්ෂාව
- අනිකුත් පුනරාවර්ථන සහ ප්‍රාග්ධන වියදම් පරීක්ෂාව
- බැංකු ගිණුම් සහ බැංකු සැසඳුම් පිළියෙළ කිරීම පරීක්ෂාව
- ආයෝජන කටයුතු පරීක්ෂාව
- ගිණුම් වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම, පරීක්ෂා කිරීම
- දායක බඳවා ගැනීම් හා අයදුම්පත් පරිගණක ගත කිරීම හා ඔප්පු නිකුත් කිරීම සහ පරීක්ෂාව
- වාරික අයකිරීම, ප්‍රේෂණය සහ ගිණුම් ගත කිරීම පරීක්ෂාව
- ප්‍රතිලාභ ගෙවීම් කටයුතු පරීක්ෂාව
- දායකත්වයෙන් ඉවත්වීම සඳහා ගෙවීම් පරීක්ෂාව
- ප්‍රවර්ධන කටයුතු සහ වැඩසටහන් පරීක්ෂාවට ලක්කිරීම
- සැලසුම් සකස් කිරීම සහ සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පරීක්ෂාව
- ක්ෂණික පරීක්ෂා කිරීම්
- දිස්ත්‍රික් කාර්යාල ඇතුළු ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම්
- විශේෂ පැවරුම්
- ජාතික විගණන කාර්යාල විගණන විමසුම් සහ වාර්තා සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධීකරණය
- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඉදිරිපත් කිරීම සම්බන්ධීකරණය

### 14.4.2.විෂය පථය

- අභ්‍යන්තර පාලන ව්‍යුහය, අධිකාරීත්ව සීමාවන් හඳුනාගැනීම සහ පරිපාලන කටයුතුවල කාර්යක්ෂමතාව සහ කාර්යය මණ්ඩල කාර්ය සාධනයේ ගුණාත්මක බව ඇගයීම
- ගණුදෙනු ක්‍රියාත්මක කිරීම, මූල්‍ය පාලනය සහ අයවැය, නීති හා රෙගුලාසිවලට දක්වා ඇති අනුකූලතාව පරීක්ෂා කිරීම
- මෙහෙයුම් ක්‍රියාවලිය සහ ප්‍රවර්ධන කටයුතුවල කාර්යක්ෂම බව සහ සාර්ථකත්වය ඇගයීම.
- වත්කම්වල පාලනය සහ ආරක්ෂාව ඇගයීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව නව ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම්වල ප්‍රගතිය ඇගයීම
- දිස්ත්‍රික් කාර්යාලවල කාර්ය සාධනය සහ මූල්‍ය හා පරිපාලන කටයුතුවල ප්‍රගතිය පරීක්ෂාව

### 14.4.3.අභ්‍යන්තර විගණන අංශයේ සත්‍ය කාර්ය මණ්ඩලය

| තනතුර | නිලධාරී සංඛ්‍යාව | 2024.12.31 දිනට සේවයේ යෙදී සිටින නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| අභ්‍යන්තර විගණක | 01 | 01 |
| විගණන නිලධාරි | 02 | 01 |
| විමර්ශන නිලධාරි | 02 | 02 |
| **එකතුව** | **05** | **04** |

### 14.4.4. විගණන කමිටු රැස්වීම්

2024 වර්ෂයේ විගණන කමිටු රැස්වීම් පැවති දිනයන්

පළමු රැස්වීම - 2024 මාර්තු 21
දෙවන රැස්වීම - 2024 ජූලි 17
තෙවන රැස්වීම - 2024 සැප්තැම්බර් 12
සිව්වන රැස්වීම - 2024 දෙසැම්බර් මාසයේදී පැවැත්වීමට සැලසුම්කර තිබූ නමුත් නව අධ්‍යක්ෂ මණ්ඩලය පත් නොවීම මත පැවැත්වීමට නොහැකි විය.

### 14.4.5. 2024 වර්ෂයේ දී ඉදිරිපත් කළ අභ්‍යන්තර විගණන වාර්තා

| | අභ්‍යන්තර විගණන වාර්තා විෂයය | ඉදිරිපත් කළ දිනය |
|---|---|---|
| 1. | අභ්‍යන්තර පාලනය ඇගයීම- දායක මුදල් ආපසු ගෙවීම | 2024.01.30 |
| 2. | වාර්ෂික සැලසුම් සකස් කිරීම | 2024.02.06 |
| 3. | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා දායකයින් බඳවාගැනීම | 2024.06.14 |
| 4. | දායක බඳවා ගැනීම - අයදුපත් පරිගණකගත කිරීම, ප්‍රධාන කාර්යාලයට එවීම සහ දායක බඳවාගැනීම් ප්‍රගතිය ඉදිරිපත් කිරීම | 2024.06.28 |
| 5. | ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය භාවිතය | 2024.09.30 |
| 6. | වාරික පරිගණකගත කිරීමේ ක්‍රියාවලිය හා හඳුනා නොගත් තැන්පතු | 2024.09.30 |
| 7. | දායක මුදල් ආපසු ගෙවීම | 2024.10.10 |
| 8. | අභ්‍යන්තර පාලන තක්සේරුව - විශ්‍රාම වැටුප් සැකසීම හා ගෙවීම් ක්‍රියාවලිය | 2024.10.15 |
| 9. | ස්ථාවර වත්කම් පාලනය | 2024.11.08 |
| 10. | වාහන පරිපාලනය හා අලුත්වැඩියා කටයුතු | 2024.11.26 |
| 11. | කුවිතාන්සි පොත් භාවිතය | 2024.11.28 |
| 12. | ආයෝජන | 2024.12.02 |
| 13. | අතිරේක අධ්‍යාපන ප්‍රතිලාභ ගෙවීම | 2024.12.03 |
| 14. | අභ්‍යන්තර පාලන තක්සේරුව - දිරිදීමනා ගෙවීම | 2024.12.17 |
| 15. | සුළු මුදල් ගෙවීම - දිස්ත්‍රික් කාර්යාල | 2024.12.24 |

### 14.4.6.දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව

| | දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව | වාර්තාව ඉදිරිපත් කළ දිනය |
|---|---|---|
| 1. | දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව - මහනුවර | 2024.04.22 |
| 2. | දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව - ගාල්ල | 2024.06.14 |
| 3. | දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව - පොළොන්නරුව | 2024.06.28 |
| 4. | දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව - මඩකලපුව | 2024.07.26 |

### 14.4.7 ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව

| | **ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව** | **වාර්තාව ඉදිරිපත් කළ දිනය** |
|---|---|---|
| 1 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරීක්ෂාව - කෑගල්ල | 2024.05.28 |

### 14.4.8 විශේෂ පැවරුම් වාර්තා

| | | |
|---|---|---|
| 1 | රත්නපුර දිස්ත්‍රික් කාර්යාලයේ 2024 මැයි මස තැපැල් වියදම් බිල්පත් දෙකක් ප්‍රතිපූර්ණය කිරීම. | 2024.07.12 |

## 14.5. තොරතුරු තාක්ෂණ ඒකකය

### 14.5.1. ප්‍රධාන කාර්යයන්

1. නව විශ්‍රාම වැටුප් තොරතුරු කළමනාකරණ මෘදුකාංග පද්ධති ස්ථාපනය කිරීමට අදාල කටයුතු සිදු කිරීම.
2. ආයතනයේ නව වෙනස්කම් සිදුකිරීමේ හා අනෙකුත් කර්තව්‍යයන් සඳහා ඉහල කළමනාකාරිත්වයට අවශ්‍ය වාර්තා ලබා දීම.
3. පරිගණක ජාලය යාවත් කාලීනව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම.
4. ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත පරිගණක වැඩසටහන් බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යාම හා සුරක්ෂිත භාවය තහවුරු කිරීම.
5. පවතින මෘදුකාංග පද්ධතියේ දත්ත සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ ඉදිරි පියවර ගැනීම.

### 14.5.2. 2024 වර්ෂයේ තොරතුරු තාක්ෂණ ඒකකයෙන් සිදු කළ කාර්යයන්

1. සමාජ ආරක්ෂණ මණ්ඩලයේ නව විශ්‍රාම වැටුප් කළමනාකරණ පරිගණක පද්ධතිය සකස් කිරීම සඳහා වන සාකච්ඡාවන් සඳහා අවශ්‍ය කටයුතු මෙහෙය වීම .
2. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ නව වෙබ් අඩවිය නව්‍ය කරණය කිරීමේ කටයුතු සිදු කිරීම.
3. සියලුම දිස්ත්‍රික් කාර්යාල වල අන්තර්ජාලය පිවිසීමට භාවිත කරන ලද 4G තාක්ෂණයෙන් යුතු ඩොන්ගල් වෙනුවට 4G තාක්ෂණයෙන් යුතු රවුටර් ලබා දීම.
4. Google sheet මෙවලම යොදාගනිමින් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ විශ්‍රාම වැටුප් ක්‍රමය සඳහා දෛනිකව බඳවා ගැනීම් පිළිබඳව වාර්තා ලබාදීම.
5. Zoom තාක්ෂණය යොදාගනිමින් පැවැත් වෙන රැස්වීම මෙහෙය වීම හා තාක්ෂණික සහය ලබාදෙමින් ආයතනික ක්‍රියාවලින් හට සහය විම.
6. දිස්ත්‍රික් කාර්යාල සඳහා වන පරිගණක හා උපාංග ලබා දීම , අළුත් වැඩියාවන් සිදු කිරීම හා තාක්ෂණික සහය ලබා දීම.
7. විශ්‍රාම වැටුප් ගෙවීම හා දෛනික රාජකාරි කටයුතු සඳහා තාක්ෂණික දායකත්වය ලබා දීම.
8. ආයතනයේ පැවතින වැඩමුළු සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම.
9. නව පරිගණක උපාංග මිල දී ගැනීමේදී අවශ්‍ය කරනු ලබන තාක්ෂණික සහය ලබා දීම හා ප්‍රසම්පාදන කටයුතු සඳහා අවශ්‍ය පිරිවිතර සකස් කිරීම.
10. අධිවේගී ඉන්ටර්නෙට් පහසුකම් ලබා දීම යටතේ ප්‍රධාන කාර්යාලයේ ADSL සබඳතාවය විසන්ධිකර නව Fiber සබඳතාවයක් ලබා දීම.
11. ආයතනයේ පවතින ඩයලොග් සබඳතා විස්තර බලා ගැනීමට Bizcare පහසුකම ලබා ගැනීම.
12. LGN 2.0 වෙත Admin පරිශීලක පහසුකම ලබා ගැනීම.
13. SSB POST ව්‍යාපෘතිය යටතේ නව මෘදුකාංග පද්ධතිය ස්ථාපනයට Cloud Space පහසුකම සහ නව Host Name (socialsecurity.lk) පහසුකම ලබා ගැනීම.

### 14.5.3.තොරතුරු තාක්ෂණ ඒකකයේ සත්‍ය කාර්යය මණ්ඩලය (2024.12.31 දිනට)

| තනතුර | | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| සමාජ ආරක්ෂණ නිලධාරි (තොරතුරු තාක්ෂණ) | - | 1 |
| දත්ත පරිපාලක | - | 1 |
| පරිගණක වැඩසටහන් සහකාර (මෘදුකාංග) | - | 1 |
| පරිගණක වැඩසටහන් සහකාර (දෘඩාංග) | - | 1 |
| ජාල සහකාර | - | 1 |
| **එකතුව** | - | **5** |

## 14.6.ප්‍රවර්ධන ඒකකය

### 14.6.1. ප්‍රධාන කාර්යයන්

1. විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය සඳහා ප්‍රචාරණ වැඩසටහන් සැලසුම් කිරීම හා මෙහෙයවීම.
2. නව ඉලක්ක කණ්ඩායම් හඳුනාගැනීම සහ එම ඉලක්ක කණ්ඩායම්වල අවශ්‍යතාවය අනුව විශ්‍රාම වැටුප් සැලසුම් සංවර්ධනය සහ හඳුන්වාදීම.
3. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ප්‍රවර්ධනය සඳහා බාහිර ආයතන, සංවිධාන හා නිලධාරීන් සම්බන්ධීකරණය කිරීම.
4. පාරිභෝගික ප්‍රතිචාර විශ්ලේෂණය සහ ඒ අනුව අවශ්‍ය සංවර්ධනයන් හඳුනාගැනීම.
5. සමාජ ආරක්ෂණය පිළිබඳ දැනුම සමාජය තුල ප්‍රචලිත කිරීම සඳහා වැඩසටහන් සැලසුම් කිරීම සහ මෙහෙයවීම.

### 14.6.2. 2024 වර්ෂයේ ප්‍රවර්ධන හා මාධ්‍ය ඒකකයෙන් සිදු කළ කාර්යයන්

1. මුල් ළමාවිය සංවර්ධන සතියට සමගාමීව පෙර පාසල් දරුවන්ගේ දෙමාපියන්, පාසල් ශිෂ්‍ය ප්‍රජාව හා ඔවුන්ගේ දෙමව්පියන් සමාජ ආරක්ෂණය පිළිබඳ දැනුවත් කිරීමේ සහ පෙර පාසල් දරුවන් වෙත සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ඔප්පු ලබාදීමේ වැඩසටහනක් බප/ජය ගොතටුව මහා විද්‍යාලයීය ශ්‍රවණාගාරයේ දී පැවැත්වීම.
2. විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය සඳහා සාමාජික බඳවාගැනීම් සිදු කරනු ලබන නිලධාරීන් ඇගයීම වෙනුවෙන් පවත්වන ලද උතුරු හා නැගෙනහිර පළාත් "සමාජ ආරක්ෂණ සම්මාන උළෙල 2024" සංවිධාන කටයුතු සිදු කිරීම.
3. තරුණ ප්‍රජාව ස්වයං රැකියා සඳහා යොමුවීම දිරිමත් කිරීම, ඔවුන්ගේ හැකියාවන් හා දක්ෂතාවයන් වැඩිදියුණු කිරීම සඳහා වූ වැඩසටහන් මාලාවක් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරි, පුහුණු මධ්‍යස්ථානවල පුහුණුව ලබන තරුණ කණ්ඩායම් ඉලක්ක කරමින් වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කිරීම.
4. පාසල් ශිෂ්‍ය ප්‍රජාව සමාජ ආරක්ෂණය සහ එහි අවශ්‍යතාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාව මෙහෙයවීම සහ අධීක්ෂණය.
5. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ප්‍රවර්ධනයට අදාළව වර්ෂය තුළ සමාජ මාධ්‍ය, ගුවන් විදුලි, රූපවාහිනී, පුවත්පත් ඔස්සේ ප්‍රචාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා වෙළඳ සන්නම් කටයුතු සිදු කිරීම.

### 14.6.3.ප්‍රවර්ධන ඒකකයේ සත්‍ය කාර්යය මණ්ඩලය (2024.12.31 දිනට)

| තනතුර | | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| සමාජ ආරක්ෂණ නිලධාරි (ප්‍රවර්ධන) | - | 1 |
| කළමනාකරණ සහකාර | - | 1 |
| **එකතුව** | - | **2** |



# පසුගිය
# වසර දහයක
# මූල්‍ය ප්‍රගතියේ
# විශේෂ අවස්ථා

## FINANCIAL HIGHLIGHTS OF THE PRECEEDING 12 YEARS
## COMPARISION OF TOTAL COLLECTIONS (WITH INTEREST) AND PAYMENTS TO MEMBERS - YEAR 2013 TO 2024

All Amounts shown in Rs. Millions




| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Total Payment (Rs.) | 143.03 | 187.80 | 213.99 | 277.24 | 307.11 | 362.44 | 359.22 | 376.34 | 430.50 | 454.81 | 488.54 | 528.99 |
| Total Collection (Rs.) | 393.97 | 360.54 | 317.05 | 318.74 | 407.65 | 467.23 | 495.58 | 459.44 | 514.42 | 674.62 | 920.08 | 760.66 |

## FINANCIAL HIGHLIGHTS OF THE PRECEEDING 12 YEARS
## COMPARISION OF TOTAL COLLECTIONS (WITHOUT INTEREST) AND PAYMENTS TO MEMBERS - YEAR 2013 TO 2024

All Amounts shown in Rs. Millions




| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Total Payment (Rs.) | 143.03 | 187.80 | 213.99 | 277.24 | 307.11 | 362.44 | 359.22 | 376.34 | 430.50 | 454.81 | 488.54 | 528.99 |
| Total Collection (Rs.) | 156.39 | 151.66 | 151.76 | 157.31 | 191.24 | 205.64 | 235.66 | 220.88 | 294.15 | 329.15 | 376.93 | 424.62 |

## FINANCIAL HIGHLIGHTS OF THE PRECEEDING 12 YEARS
## INTEREST INCOME - YEAR 2013 TO 2024

All Amounts shown in Rs. Millions




| | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Interest Income (Rs.) | 237.57 | 208.88 | 165.28 | 161.43 | 216.41 | 261.59 | 259.92 | 238.56 | 220.26 | 345.48 | 543.16 | 336.04 |



# මුල්‍ය විශ්ලේෂණය සහ මෙහෙයුම් කාර්ය සාධනය

SSB

## FINANCIAL HIGHLIGHTS- LAST 10 YEARS (FY2013- FY2023)

| Description | | Years | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| New Enrolments for the year | No's | 8,769 | 15,995 | 21,271 | 71,364 | 63,674 | 83,350 | 38,591 | 25,783 | 32,078 | 57,596 | | |
| Avg. no. of members for pension | No's | 15,821 | 20,157 | 22,629 | 25,263 | 27,080 | 28,742 | 30,598 | 31,769 | 32,976 | 34,280 | | |
| | | | | | | | | | | | | | |
| **Cash Inflow** | | | | | | | | | | | | | |
| Members collections | Rs | 156,393,155.00 | 151,660,082.00 | 151,763,891.00 | 157,312,782.00 | 191,236,129.00 | 205,641,471.00 | 235,661,355.00 | 220,875,820.00 | 294,152,727.00 | 329,145,803.00 | 376,926,910.00 | 424,621,485.00 |
| Interest Income | Rs | 237,574,919.00 | 208,879,725.00 | 165,282,624.00 | 161,431,297.00 | 216,409,371.00 | 261,591,395.00 | 259,919,300.00 | 238,562,470.00 | 220,263,741.00 | 345,475,143.00 | 543,161,844.00 | 336,039,301.00 |
| **Total collection for the years** | **Rs** | **393,968,074.00** | **360,539,807.00** | **317,046,515.00** | **318,744,079.00** | **407,645,500.00** | **467,232,866.00** | **495,580,655.00** | **459,438,290.00** | **514,416,468.00** | **674,620,946.00** | **920,088,754.00** | **760,660,786.00** |
| | | | | | | | | | | | | | |
| **Cash Outflow** | | | | | | | | | | | | | |
| Pension Payment | Rs | 127,502,515.00 | 167,727,733.00 | 186,934,897.00 | 234,792,979.00 | 263,264,719.00 | 313,143,500.00 | 312,727,588.00 | 331,553,955.00 | 356,981,876.00 | 380,424,646.00 | 407,000,980.00 | 426,410,069.00 |
| Refund | Rs | 10,367,065.00 | 15,222,020.00 | 24,444,852.00 | 38,481,516.00 | 38,055,553.00 | 32,513,063.00 | 25,304,571.00 | 27,946,174.00 | 18,370,909.00 | 31,448,787.00 | 22,712,140.00 | 25,203,731.00 |
| Death Benefit | Rs | 2,491,977.00 | 2,079,906.00 | 2,139,519.00 | 2,087,804.00 | 1,747,940.00 | 1,962,534.00 | 2,103,055.00 | 2,135,828.00 | 1,584,866.00 | 1,572,044.00 | 2,404,513.00 | 533,000.00 |
| Disable Benefits | Rs | 620,584.00 | 714,620.00 | 404,275.00 | 545,637.00 | 627,967.00 | 543,279.00 | 657,064.00 | 589,719.00 | 713,451.00 | 527,026.00 | 658,570.00 | 627,972.00 |
| Incentives | Rs | 2,043,704.00 | 2,052,379.00 | - | 1,274,872.00 | 880,610.00 | 9,439,135.00 | 15,649,535.00 | 11,188,589.00 | 49,743,046.00 | 35,306,023.00 | 48,338,909.00 | 67,291,441.00 |
| Benificiary Payments | Rs | - | - | 64,000.00 | 57,500.00 | 2,536,568.00 | 4,842,660.00 | 2,775,394.00 | 2,928,000.00 | 3,106,499.00 | 5,528,349.00 | 7,428,819.00 | 8,926,000.00 |
| **Total Cash Outflow** | **Rs** | **143,025,845.00** | **187,796,658.00** | **213,987,543.00** | **277,240,308.00** | **307,113,357.00** | **362,444,171.00** | **359,217,207.00** | **376,342,265.00** | **430,500,647.00** | **454,806,875.00** | **488,543,931.00** | **528,992,213.00** |
| **Excess / Shortage** | **Rs** | **250,942,229.00** | **172,743,149.00** | **103,058,972.00** | **41,503,771.00** | **100,532,143.00** | **104,788,695.00** | **136,363,448.00** | **83,096,025.00** | **83,915,821.00** | **219,814,071.00** | **431,544,823.00** | **231,668,573.00** |
| **Investment Value** | **Rs** | **1,617,153,979.00** | **1,717,590,837.00** | **1,818,136,272.00** | **1,874,773,791.00** | **1,941,057,650.00** | **1,937,822,662.00** | **1,870,775,003.00** | **1,741,510,030.00** | **1,654,232,844.00** | **2,371,021,770.00** | **3,019,434,247.00** | **3,146,391,023.00** |

# අනු කමිටු



විගණන කමිටු වාර්තාව

ආයෝජන කමිටු වාර්තාව

## විගණන කමිටු වාර්තාව

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 01/2021 අනුව නිකුත් කර ඇති Guidelines on Corporate Governance for State Owned Enterprises මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 උපඡේදය පරිදි ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ විගණන කමිටුව පත් කර ඇත.

1. **2024 වර්ෂයේ විගණන කමිටුව**

| | | |
|---|---|---|
| හිමාලි බෝගොඩගෙදර මහත්මිය | - | අධ්‍යක්ෂ (කමිටු සභාපති) |
| කේ.කේ.ඩී.කුමාරසිරි කන්නන්ගර මහතා | - | අධ්‍යක්ෂ (කමිටු සාමාජික) |
| කේ.එච්.වී.ජයතිලක මහතා / කේ.කපිල ගජපාල මහතා | - | අධ්‍යක්ෂ (කමිටු සාමාජික) |
| විගණන කමිටු නිරීක්ෂණකයන් | | |
| ඩී.එම්.ජී.වී.මල්කාන්ති මහත්මිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක (නිරීක්ෂක ) රේඛීය අමාත්‍යංශය |
| එම්.ඩී.කේ.මලගල මහත්මිය / කේ.කරුණාරත්න මහතා | - | විගණන අධිකාරී (නිරීක්ෂක) ජාතික විගණන කාර්යාලය |

2. **විගණන කමිටු අරමුණු**

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ විගණන කමිටුවේ අරමුණු පහත සඳහන් පරිදි විය.

- ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ක්‍රියාත්මක කර ඇති විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය වඩාත් කාර්යක්ෂමව සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් සහ නිර්දේශ ලබාදීම.
- පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් දැරීම, ගිණුම්ගත කිරීම සහ වාර්තා ඉදිරිපත් කිරීම , මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, චක්‍රලේඛ ඇතුළු අනෙකුත් මාර්ගෝපදේශවලට අනුකූලව සිදුකිරීම සඳහා මඟපෙන්වීම.
- විගණන කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසුවිපරම් කිරීම සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමුකරවීම මඟින් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සමස්ත කාර්යසාධනය ඉහළ නංවා ගැනීමට දායක වීම.

3. **විගණන කමිටු කාර්යයභාරය**

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ක්‍රියාත්මක කර ඇති විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට වැඩි පිරිසක් දායක කර ගැනීම, යෝජනා ක්‍රමයන් තුළ රඳවා ගැනීම සහ එම දායකත්වයන් වෙත කාර්යක්ෂමව ප්‍රතිලාභ ගෙවීම සඳහා සිදුකල යුතු කාර්යයන් නිසිපරිදි ක්‍රියාත්මක වීම සහ නීතිරීතිවලට අනුකූලතාව දැක්වීම තහවුරු කර ගැනීම සඳහා පහත සඳහන් කරුණු පිළිබඳව විගණන කමිටුව පරීක්ෂා කර බැලීම සිදුකරන ලදී.

(1). විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට දායක බඳවාගැනීම සහ ඔප්පු නිකුත් කිරීම පිළිබඳව පරීක්ෂා කර නිර්දේශ ලබාදීම.

(2). වාරික මුදල් රැස්කිරීම් සහ ආයෝජන පිළිබඳව පරීක්ෂා කර නිර්දේශ ලබාදීම.

(3). විශ්‍රාම වැටුප් ඇතුළු දායක ප්‍රතිලාභ ගෙවීම් පිළිබඳව පරීක්ෂා කර කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

(4). ප්‍රචාරණ සහ ප්‍රවර්ධන වැඩසටහන්වල ඵලදායීබව පරීක්ෂා කර නිර්දේශ ලබාදීම.

(5). පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් දැරීම මුදල් රෙගුලාසි, චක්‍රලේඛ සහ අනෙකුත් මාර්ගෝපදේශවලට අනුව සිදුකර තිබේද යන්න පරීක්ෂා කර නිර්දේශ ලබාදීම සහ පරිපාලන කටයුතු පිළිබඳව නිර්දේශ ලබාදීම.

**4. <u>අභ්‍යන්තර විගණනය</u>**

අභ්‍යන්තර විගණන වාර්ෂික විගණන සැලැස්ම අනුමත කිරීම, අභ්‍යන්තර විගණන අංශයේ කාර්තු වාර්තාව සහ අභ්‍යන්තර විගණන වාර්තා නිරීක්ෂණ සහ එම විගණන නිරීක්ෂණ සඳහා අංශ විසින් ලබාදී ඇති පිළිතුරු පරීක්ෂා කර, විගණන නිරීක්ෂණවලින් පෙන්වා දී ඇති දුර්වලතා අවම කර ගැනීම සඳහා නිර්දේශ ලබාදීම සිදුවිය.

**5. <u>විගණකාධිපති විගණන විමසුම් සහ කෙටුම්පත් විගණකාධිපති වාර්තා</u>**

ජාතික විගණන කාර්යාලය මගින් යොමුකර තිබූ විගණන විමසුම් සහ කෙටුම්පත් විගණකාධිපති වාර්තා නිරීක්ෂණ සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා නිර්දේශ ලබාදීමද 2024 වර්ෂය තුළ පැවති විගණන කමිටු රැස්වීම්වලදී සිදුකරනු ලැබීය.

**6. <u>විගණන කමිටු රැස්වීම් - 2024 වර්ෂය</u>**

පළමු රැස්වීම - 2024 මාර්තු 21
දෙවන රැස්වීම - 2024 ජූලි 17
තෙවන රැස්වීම - 2024 සැප්තැම්බර් 12
සිව්වන රැස්වීම - 2024 වර්ෂයේ අවසන් කාර්තුව තුළ පැවැත්වීමට සැලසුම් කර තිබුණි.
2024 ඔක්තෝම්බර් මාසයේ දී විගණන කමිටු සාමාජිකයන් ලෙස කටයුතු කල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ධුරවලින් ඉවත්වීම අනුව රැස්වීම පැවැත්වීමට නොහැකි විය.

විගණන කමිටුව වෙනුවෙන්,

හිමාලි බෝගොඩගෙදර
විගණන කමිටු සභාපති
2025.04.

**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය**
**ග්‍රාමීය සංවර්ධන ,සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගන්වීම් අමාත්‍යාංශය**
**ආයෝජන කමිටු වාර්තාව - 2024**

**01.සංයුතිය**

සමාලෝචිත වර්ෂය තුළ කමිටුවේ සාමාජිකයින් පහත සඳහන්පරිදි විය :

| | |
|---|---|
| පී.එස්.එස්.දික්වැල්ල | සභාපති |
| එම්.කේ.බී.දිසානායක | සභාපති |
| කේ.ඒ .එස්.පී.කළුආරච්චි | සාමාන්‍යාධිකාරී |
| එච්.ජී.එස්.ටී.විද්‍යාරත්න | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මුදල් |
| කේ.බී.ජී.එච්.එන්.කාරියවසම් | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මුදල් |
| ඩබ්.එස්.පී.ප්‍රනාන්දු | සහකාර සාමාන්‍යාධිකාරී- මුදල් |

**02.රැස්වීම්**

| නම | සහභාගී වූ රැස්වීම් ගණන |
|---|---|
| පී.එස්.එස්.දික්වැල්ල | 19 / 28 |
| එම්.කේ.බී.දිසානායක | 03 / 28 |
| කේ.ඒ .එස්.පී.කළුආරච්චි | 28 / 28 |
| එච්.ජී.එස්.ටී.විද්‍යාරත්න | 08 / 28 |
| කේ.බී.ජී.එච්.එන්.කාරියවසම් | 11 / 28 |
| ඩබ්.එස්.පී.ප්‍රනාන්දු | 17 / 28 |

ආයෝජන කමිටුව නිසි පරිදි අදාළ අභ්‍යන්තර සාමාජිකයින්ගෙන් සමන්විත වේ.අවදානම් නැඹුරුවක් සහිත ආයෝජන පිළිබඳ අදහස් සහ මතය දැනගැනීම සඳහා කමිටුව සෑම ආයෝජනයකටම පෙර රැස්වේ.

ආයෝජන සම්බන්ධයෙන් මණ්ඩලයේ මූලික පරමාර්ථය වන්නේ ,මූල්‍ය බැඳීම් සපුරාලීම සඳහා ද්‍රවශීලතාවය කළමනාකරණය කරන අතරතුර අදාළ ආයෝජිත මුල් මුදල ආරක්ෂා කරගැනීම වන අතර, අනුදත් ආයෝජනය ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් උපරිම ආයෝජන ප්‍රතිලාභ ඊට ලබාදීමයි.එහි ප්‍රතිඵලයක් වශයෙන්,මණ්ඩලය පහත සඳහන් තෙවැදෑරුම් ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සහතික කිරීමට උත්සහ කරයි.

- **සුරක්ෂිතභාවය**

  ආයෝජන මුල ධනයේ ආරක්ෂාව සලසා ගැනීම මණ්ඩලයේ ප්‍රමුඛ පරමාර්ථය වන්නේය. මෙම මූල ධනයේ ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා කටයුතු කිරීම පිණිස මණ්ඩලයේ සමස්ථ අතිරික්ත අරමුදල රාජ්‍ය බැංකු වල ස්ථාවර තැන්පතු ලෙස ආයෝජනය කරයි.

- **ද්‍රවශීලතාවය**

  මූල්‍ය අවාසියක් ඇති නොවන පරිදි ඉදිරියේදී අපේක්ෂා කළ හැකි සියලු මෙහෙයුම් කටයුතුවල අවශ්‍යතාව සපුරා ගැනීමට හැකිවන පරිදි ද්‍රවශීලතා මට්ටමක් පවත්වා ගැනීමට ආයෝජන කමිටුව කටයුතු කරයි.

- **ආයෝජන මත ප්‍රතිලාභ**

  ලබාගත හැකි ඉහළම ප්‍රතිලාභ අත්කර ගැනීම සඳහා ආයෝජන සමුච්චය සැලසුම් කලයුතු වන්නේ ගිණුම් සීමාවන් හා මුදල් ප්‍රවාහ අවශ්‍යතා සැලකිල්ලට ගෙනය. ඒ අනුව,ඉහළ පොළී අනුපාත සහ ආයෝජන අවදානම සැළකිල්ලට ගනිමින් 2024 වර්ෂයේ ආයෝජනයන් 12.50% ,12.70% , 11.75%, 11.60%, 09.50%, 09.25% , 09.00%, 09.35% ,සහ 08.65% යන පොලී ප්‍රතිශතයටතේ ආයෝජනය කර ඇත.

.................................
කේ.බී.ජී.එච්.එන්.කාරියවසම්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මුදල්

.................................
කේ.ඒ.එස්.පී.කළුආරච්චි
සාමාන්‍යාධිකාරී

# විගණකාධිපතිවරයාගේ වාර්තාව

# 2024 විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම

## අවසන් ගිණුම් ප්‍රකාශන

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එල්එස්ඩබ/ඩී/එස්එස්බී/එෆ්එස්/2024 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 මැයි 30 දින

විගණන අංශය
30 JUN 2025
සමාජ ආරක්ෂණ මණ්ඩලය

සභාපති,
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 88 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශන මුහුණතෙහි ඉදිරිපත් කළ යුතු තොරතුරු යටතේ තොග සඳහන් කල යුතු වුවද වෙනත් වත්කම් යටතේ සඳහන් කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07හි 49 ඡේදය ප්‍රකාරව වත්කම් අයත් වන දේපල පිරියත උපකරණ මුළු පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් මණ්ඩලය විසින් 2024 ජනවාරි 01 දිනට පිරිවැය වූ රු.18,647,000 ක් වූ මෝටර් රථ වාහන වලින් පිරිවැය රු.17,765,000 ක් වූ මෝටර් රථ වාහන 07 ක් පමණක් රු.28,850,000 කට සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර තිබුණි.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

(ඇ) බැංකු ජංගම ගිණුමේ රු.4,339,821ක් වූ බැංකු අයිරාව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස දැක්විය යුතු වුවත් ජංගම වත්කම් යටතේ අතැති මුදල් හා බැංකු ශේෂය තුළ දක්වා තිබීම හේතුවෙන් මුදල් හා බැංකු ශේෂය හා ජංගම වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාල ගැලපීම් රු.14,729,764 ක වටිනාකම සඳහා මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණු අතර, ඒ පිළිබඳ මණ්ඩලයේ තොරතුරු වලින් අදාල වටිනාකම හඳුනාගත නොහැකි විය.

(ඉ) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම වල සාමාජිකයන් විසින් බැංකු ගිණුම් වල තැන්පත් කරන ලද වාරික මුදල් සාමාජිකයන්ගේ අනන්‍යතාවය හඳුනාගෙන එම කේවල ගිණුම්වලට ගිණුම් ගත කරනු වෙනුවට හඳුනා නොගත් තැන්පතු ලෙස 2004 සිට 2024 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.3,858,800 ක් ඉකුත් වර්ෂ වලට අදාළ ගැලපීම් යටතේ අරමුදලට ගලපා තිබුණු අතර එම ශේෂය තුල 2024 වර්ෂයට අදාල රු.624,877 ක ශේෂ ක් ද ඇතුළත්ව තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් මණ්ඩලයේ 2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබා ගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

## 1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇති වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම

හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2. 1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුවම අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව

| | නීති, නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 177, 2023 දෙසැම්බර් 29 දිනැති අංක 05/2023 අයවැය චක්‍රලේඛය සහ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024 ජුලි 15 දිනති | 2023 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව වැටුප් හා වේතන සඳහා 2023 නොවැම්බර් මාසයේ සත්‍ය වියදම් පදනම් කරගෙන රු.මිලියන 8.727 ක් ඉල්ලීම කිරීම වෙනුවට රු.මිලියන 15.7 ක අක්මුදල් ඉල්ලීම කර තිබුණි.<br>ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබූ රු. මිලියන1.87 ක මුදල මහා භාණ්ඩාගාරයට බැර කල යුතු වුවද රු.මිලියන1.38ක |

| | |
|---|---|
| අංක TO/CFM/01/06/02(i) දරන ලිපිය | මුදලක් පමණක් 2024 සැප්තැම්බර් 20 දින මහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට බැර කර තිබුණි. |
| (ආ) 2019 දෙසැම්බර් 17 දිනැති අංක පීඊඩී/08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2020 වර්ෂයේ සිට විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත විය යුතු වුවද මණ්ඩලය විසින් ජාතික විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියෙහි සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ලියාපදිංචි වී නොතිබුණි. |

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

| බලතල, කර්තව්‍ය සහ කාර්යයන් යොමුව | අනුකූල නොවීම |
|---|---|
| 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනතේ 22 වගන්තිය | මණ්ඩලයට වහා අවශ්‍ය නොවන මණ්ඩලයේ අරමුදලෙහි ඇති සියලුම මුදල්, අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව බලය දෙනු ලබන යම් ආකාරයකින් එසේ බලය දෙනු ලබන යම් සුරැකුම්පත් වල මණ්ඩලය විසින් ආයෝජනය කල යුතු වුවද එකතු වටිනාකම රු.3,165,578,331 ක ආයෝජනයන් සඳහා එකඟතාවයක් ලබා ගෙන නොතිබුණි. |

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම අනුව සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට නව මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා රු. 12,511,000 ක් වූ ප්‍රතිපාදනයක් මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා අදාල සැපයුම්කරු සමඟ ගිවිසුම් ගත වී තිබුණි. 2019 පෙබරවාරි 14 වන දින පලමු සැපයුම් කට්ටලයට අදාලව සියයට 10 ක ගෙවීමක් ලෙස රු: 1,009,250 ක් ගෙවීම සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 08 ක කාලයක් ගත වී ඇතත් පරිගණක පද්ධතිය ස්ථාපනය කිරීමට අපොහොසත් වී තිබුණි. මෙම භාණ්ඩාගාර ප්‍රතිපාදනය ස්ථාවර තැන්පත් වල ආයෝජනය කරමින් පවතින අතර 2024 දෙසැම්බර් 31 දිනට රු. 19,187,308 දක්වා තැන්පතු මුදල වර්ධනය වී තිබුණු අතර ඒ සඳහා රු.2,010,525 ක ආයෝජන පොළී ආදායමක් ලබා ගෙන තිබුණද, ප්‍රතිපාදන වලින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ආ) මණ්ඩලය විසින් 2017 වර්ෂයේදී ආරම්භ කර තිබුණු කලාකරුවන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමය වෙනුවෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය රු. මිලියන 94 ක මුදලක් ලබා දී තිබුණි. එම මුදල් බැංකු ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ ශේෂය රු. මිලියන 186.64 ක් දක්වා වර්ධනය කරගෙන තිබුණි. ඒ අනුව කලාකරුවන් වෙනුවෙන් ලැබුණු මුදල අදාල කාර්යය සඳහා නිසි පරිදි යෙදවීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂ සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දී සාමාජිකයන් බඳවා ගැනීම අඩුමට්ටමක පැවැති අතර 1999 අංක 33 දරණ පනතින් සංශෝධිත 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩල පනත හා 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/05 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද රෙගුලාසි අංක 04 අනුව ව්‍යවස්ථාපිත ප්‍රධාන අරමුණ වන විශ්‍රාම වැටුප් හිමිකම ලබා නොසිටින හෝ විශ්‍රාම වැටුප් සහිත තනතුර නොදරන සියලු සේවා නියුක්තිකයන් වෙත සමාජ ආරක්ෂණ හා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම. ඒ අනුව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට සලසා දීමට

අපේක්ෂිත අරමුණු ඉටු නොකිරීම හේතුවෙන් පහත සඳහන් පරිදි කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු ප්‍රමාණයක පැවතුණි.

(i) සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට විශ්‍රාම වැටුප් ක්‍රමයට නව දායකයින් බඳවා ගැනීමේදී අය කල පළමු වාරික මුදල් එකතුව රු.මිලියන 163.29 ක් වූ අතර වාර්ෂික රැස් කිරීම් රු.මිලියන 261.77 විය.සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ආදායම වූ රු.මිලියන 769.55 ක මුදල සාමාජිකයින්ගේ දායක මුදලින් හා ආයෝජන පොලී ආදායම් වලින් සමන්විත වූ අතර ප්‍රධාන ආදායම වන සාමාජිකයින්ගේ දායක මුදල් වලින් සමාලෝචිත වර්ෂය තුළදී සාමාජිකයන් 539 ක් විශ්‍රාම වැටුප හිමිවන දිනට පෙර හා විශ්‍රාම වැටුප හිමිවන දිනට පසු ඉවත්වීම හේතුවෙන් රු.මිලියන 22.12ක් ආපසු ගෙවා තිබුණි.

(ii) කාර්ය සාධන වාර්තාව අනුව 2024 දෙසැම්බර් 31 දක්වා විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයින් 55,964 ක් බඳවාගෙන තිබුණද ඔප්පු නිකුත් කර තිබුණේ දායකයින් 25,510 පමණි.එනම් සියයට 46 කට පමණි.

(iii) වෘත්තීය පුහුණු ආයතනවල හා තරුණ කණ්ඩායම් වල සිසුන් 400 ක් සඳහා රු.200,000 ක් වැය කර ස්වයං රැකියා / ව්‍යවසායකත්ව හැකියාවන් වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම අපේක්ෂා කළ ද සිසුන් 298 ක් සඳහා පමණක් වැඩසටහන් පවත්වා තිබුණි.

(iv) අක්‍රිය සාමාජිකයන් නැවත සක්‍රිය කිරීමේ ව්‍යාපෘතිය මගින් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන ක්‍රියාකාරකම් 05ක් යටතේ සාමාජිකයන් 2000ක් සක්‍රිය කර රු. මිලියන 10ක් රැස්කිරීමට සැලසුම් කළද සාමාජිකයන් 316ක් පමණක් සක්‍රිය කර තිබුණු අතර රැස්කළ මුදල රු. මිලියන 5.47ක් විය.

(v) පෙර වර්ෂ ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.මිලියන 17.03 ක් වැය කර නව විශ්‍රාම වැටුප් තොරතුරු කළමනාකරණ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමට සැලසුම් කලද සැපයුම්කරුවකු තෝරා ගැනීම හා ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කිරීම පමණක් සිදුකර තිබුණි.

(ඇ) සේවක ණය ශේෂයෙහි ඇතුළත් ආපදා ණය II යටතේ රු.88,999 ක ශේෂය 2000 වර්ෂයේ සිට පැවත එන අතර වසර 16 ක් ගත වී තිබුණද අය කර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. 2022 වර්ෂයේදී නිලධාරියෙකු වෙත ලබා දී තිබූ ණය රු.130,561 ක් හා පොලී ලෙස රු.14,623 කින් 2024 වර්ෂයේ කිසිදු වාරික මුදලක් අයකර නොතිබුණි.

## 2.3 වෙනත් කරුණු

(අ) නිලධාරීන් දීර්ඝකාලීනව ස්ථාන මාරු ඉල්ලීම නොකිරීම, කළමනාකරණය විසින් ස්ථාන මාරු කිරීමට කටයුතු නොකිරීම, මණ්ඩලයේ අභ්‍යන්තර මාරු කිරීම හා රාජකාරී විෂයයන් මාරු කළ හැකි නිලධාරීන්, දීර්ඝකාලීනව එක් රාජකාරී විෂයයක් ඉටු කිරීම වැනි කරුණු හේතුවෙන් නිලධාරියකු ස්ථාන මාරු කිරීමෙන් සපුරා ගැනීමට බලාපොරොත්තු වන නිලධාරියාගේ වෘත්තීය සංවර්ධනය, දක්ෂතා ප්‍රවර්ධනය, අත්දැකීම් ලබා ගැනීම, ආයතනයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව වර්ධනය කිරීම ඇතුළු අරමුණු දෙපාර්තමේන්තුවට ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 198 හා තත්ත්ව කාර්ය මණ්ඩලය 151 ක් වූ අතර තනතුරු 09 ක පුරප්පාඩු 47 ක් පැවතුණි. තනතුරු 03 ක් සඳහා නිලධාරීන් 09 දෙනෙකුට වැඩ බැලීමේ රාජකාරි පත්වීම ලබා දී තිබුණි.

ජී.එච්.බී. ධර්මපාල
විගණකාධිපති (වැ.බ)

6

**<u>ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පණතේ 12 වන වගන්ති ප්‍රකාරව - විගණකාධිපති වාර්තාව සහ ඒ පිළිබඳ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කළමණාකාරීත්වයේ අදහස් දැක්වීම.</u>**

| යොමු අංකය | විගණකාධිපති වාර්තාවේ ඇතුලත් නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම |
|---|---|---|
| **1.2** | **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම** | |
| **1.2 (අ)** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 88 ඡේදය ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශන මුහුණතෙහි ඉදිරිපත් කළ යුතු තොරතුරු යටතේ තොග සඳහන් කල යුතු වුවද වෙනත් වත්කම් යටතේ සඳහන් කර තිබුණි. | එකඟ වේ. 2025 වර්ෂයේ සිට නිවැරදි කිරීමට කටයුතු කෙරේ. |
| **1.2 (ආ)** | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07හි 49 ඡේදය ප්‍රකාරව වත්කම් අයත් වන දේපල පිරියත උපකරණ මුළු පන්තියම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් මණ්ඩලය විසින් 2024 ජනවාරි 01 දිනට පිරිවැය වු රු.18,647,000 ක් වූ මෝටර් රථ වාහන වලින් පිරිවැය රු.17,765,000 ක් වු මෝටර් රථ වාහන 07 ක් පමණක් රු.28,850,000 කට සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර තිබුණි. | එකඟ වේ. ඉතිරි වාහන 14 (යතුරුපැදි) 2025 වර්ෂය තුල ප්‍රත්‍යාගණනය කර වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කිරීමට සටහන් කර ගන්නා ලදී. |
| **1.2 (ඇ)** | බැංකු ජංගම ගිණුමේ රු.4,339,821ක් වු බැංකු අයිරාව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස දැක්විය යුතු වුවත් ජංගම වත්කම් යටතේ අතැති මුදල් හා බැංකු ශේෂය තුළ දක්වා තිබීම හේතුවෙන් මුදල් හා බැංකු ශේෂය හා ජංගම වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | එකඟ වේ. 2025 වර්ෂයේ බැංකු අයිරාව ජංගම වගකීම් යටතේ ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත |
| **1.2 (ඈ)** | ඉකුත් වර්ෂයට අදාල ගැලපීම් රු.14,729,764 ක වටිනාකම සඳහා මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණු අතර, ඒ පිළිබඳ මණ්ඩලයේ තොරතුරු වලින් අදාල වටිනාකම හඳුනාගත නොහැකි විය. | එකඟ වේ. ඉදිරියේදී මෙවැනි ගණුදෙණු හෙළිදරව් කිරීම අතපසු වීම් සිදු නොකිරීමටත් අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කිරීමටත් කටයුතු කරනු ලැබේ. |
| **1.2 (ඉ)** | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම වල සාමාජිකයන් විසින් බැංකු ගිණුම් වල තැන්පත් කරන ලද වාරික මුදල් සාමාජිකයන්ගේ අනන්‍යතාවය හඳුනාගෙන එම කේවල ගිණුම්වලට ගිණුම් ගත කරනු වෙනුවට හඳුනා නොගත් තැන්පතු ලෙස 2004 සිට 2024 දෙසැම්බර් 31 දක්වා එකතුව රු.3,858,800 ක් ඉකුත් වර්ෂ වලට අදාළ ගැලපීම් යටතේ අරමුදලට ගලපා තිබුණු අතර එම ශේෂය තුල 2024 වර්ෂයට අදාල රු.624,877 ක ශේෂ ක් ද ඇතුළත්ව තිබුණි. | හඳුනානොගත් තැන්පතු අධ්‍යක්ෂ මණ්ඩල උපදෙස් මත සමුච්චිත අරමුදලට මාරු කිරීමට කටයුතු කර ඇත. |

| යොමු අංකය | විගණකාධිපති වාර්තාවේ ඇතුලත් නිරීක්ෂණ | | කළමණාකරණයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 2.2.1 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුවම අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව. | | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගෙන් Related party transactions පිළිබඳ ලියවිලි ලබා ගැනීමට කටයුතු කරනු ඇත. |
| 2.2.2 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව | | |
| 2.2.2 | **නීති, නීති රිතී හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | 2023 දෙසැම්බර් මස අපේක්ෂිත වියදම් සහ අපේක්ෂිත උපචිත වියදම් සඳහා අදාල මුදල ලබා ගැනීමට කටයුතු කර ඇත.කෙසේ වුවද, ඒ පිළිබඳව ජාතික අයවැය දෙපාර්තුමේන්තුවේ 2024.11.01 දිනැති ලිපිය (ඇමුණුම 2 - I) මඟින් ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව පහත පරිදි කටයුතු කර ඇත.<br>I. 2023 දෙසැම්බර් මස වියදම් සහ උපචිත වියදම් පියවීම සඳහා රු.12,529,723 ක් යොදා ගැනීම.<br>i. භාණ්ඩාගාරයේ ලැබිය යුතු මුදල් සඳහා 1,784,647ක් හිලව් කිරීම.(ඇමුණුම 2 - II)<br>ii. භාණ්ඩාගාරය වෙත රු.1,385,630ක් ආපසු යැවීමට කටයුතු කිරීම.(ඇමුණුම 2 - III) |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 177, 2023 දෙසැම්බර් 29 දිනැති අංක 05/2023 අයවැය චක්‍රලේඛය සහ භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024 ජුලි 15 දිනති අංක TO/CFM/01/06/02(i) දරන ලිපිය | 2023 වර්ෂයේ දෙසැම්බර් මාසයට අදාලව වැටුප් හා වේතන සඳහා 2023 නොවැම්බර් මාසයේ සත්‍ය වියදම පදනම් කරගෙන රු.මිලියන 8.727 ක් ඉල්ලීම් කිරීම වෙනුවට රු.මිලියන 15.7 ක අක්මුදල් ඉල්ලීම් කර තිබුණි.<br>ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබු රු. මිලියන1.87 ක මුදල මහා භාණ්ඩාගාරයට බැර කල යුතු වුවද රු.මිලියන1.38ක මුදලක් පමණක් 2024 සැප්තැම්බර් 20 දින මහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට බැර කර තිබුණි. | |

| යොමු අංකය | විගණකාධිපති වාර්තාවේ ඇතුලත් නිරීක්ෂණ | | කළමණාකරණයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ආ) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක පීඊඩී/08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2020 වර්ෂයේ සිට විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත විය යුතු වුවද මණ්ඩලය විසින් ජාතික විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියෙහි සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ලියාපදිංචි වි නොතිබුණි. | ජාතික ඊ - රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියෙහි ලියාපදිංචි වීමට පසුගිය වර්ෂයේදී උත්සාහ කල ද එය මාර්ගගත ක්‍රමයට සිදු කර ගැනීමට අප ආයතනය එම පද්ධතියේ දත්ත සමුදාය තුළ ඇතුලත් නොවුනු නිසා සිදු කර ගත් නොහැකි විය. කෙසේ නමුත් අදාල ආයතනයේ සහාය ඇතිව Procument Entity ලෙස අංක P000942 යටතේ 2025.06.11 දින ජාතික ඊ - රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතියේ ලියාපදිංචි වී ඇත. |
| 2.2.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව | | |
| | **බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට යොමුව** | අනුකූල නොවීම | |
| | 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනතේ 22 වගන්තිය | මණ්ඩලයට වහා අවශ්‍ය නොවන මණ්ඩලයේ අරමුදලෙහි ඇති සියලුම මුදල්, අමාත්‍යවරයා විසින් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව බලය දෙනු ලබන යම් ආකාරයකින් එසේ බලය දෙනු ලබන යම් සුරැකුම්පත් වල මණ්ඩලය විසින් ආයෝජනය කල යුතු වුවද එකතු වටිනාකම රු.3,165,578,331 ක ආයෝජනයන් සඳහා එකඟතාවයක් ලබා ගෙන නොතිබුණි. | ආයතනයේ විශ්‍රාම වැටුප් අරමුදලේ මුදල් ආයෝජනය කරනු ලබන්නේ මුදල් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය පොදු ව්‍යාපාර චක්‍රලේක 02/2018 (දිනය 14.11.2018) අනුව රජයේ අනුමත ආයතන සහ එහි පරිපාලිත සමාගම්වලය. ආයොජනයන් කල්පිරීමේදී ප්‍රායෝගිකව විෂයභාර ඇමතිතුමාගේ සහ මුදල් ඇමතිතුමාගේ එකඟත්වය ලබා ගැනීමට වැඩි කාලයක් ගතවන නිසා ආයොජනයන් සිදු නොකොට අක්‍රියව මුදල් ගිණුම්වල තබා ගැනීමට සිදු වේ. මෙම කාල ප්‍රමාදය නිසා විශාල ආයෝජන පොලී ප්‍රමාණයක් ආයතනයට අහිමි වී යා හැක. එබැවින් පනතේ සඳහන්ව තිබුණද විෂයභාර ඇමතිතුමාගේ සහ මුදල් ඇමතිතුමාගේ එකඟතාවය ලබා ගැනීම ප්‍රායෝගික නොවේ.කෙසේ වුව ද මේ පිළිබඳව විෂයභාර ඇමතිතුමාගෙන් සහ මුදල් |

| යොමු අංකය | විගණකාධිපති වාර්තාවේ ඇතුලත් නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | | ඇමතිතුමාගෙන් ආයෝජන පිළිබඳව පොදුවේ එකඟතාවක් ලබා ගැනීමට ඉදිරියේ දී කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. |
| 2.2.4 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව. | |
| 2.2.4 (අ) | ප්‍රසම්පාදන සැලැස්ම අනුව සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ක්‍රමයට නව මෘදුකාංග පද්ධතියක් ස්ථාපනය කිරිම සඳහා රු. 12,511,000 ක් වූ ප්‍රතිපාදනයක් මහා භාණ්ඩාගාරයෙන් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා අදාල සැපයුම්කරු සමඟ ගිවිසුම් ගත වී තිබුණි. 2019 පෙබරවාරි 14 වන දින පලමු සැපයුම් කට්ටලයට අදාලව සියයට 10 ක ගෙවීමක් ලෙස රු: 1,009,250 ක් ගෙවීම් සිදුකර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 08 ක කාලයක් ගත වී ඇතත් පරිගණක පද්ධතිය ස්ථාපනය කිරීමට අපොහොසත් වි තිබුණි. මෙම භාණ්ඩාගාර ප්‍රතිපාදනය ස්ථාවර තැන්පත් වල ආයෝජනය කරමින් පවතින අතර 2024 දෙසැම්බර් 31 දිනට රු. 19,187,308 දක්වා තැන්පතු මුදල වර්ධනය වී තිබුණු අතර ඒ සඳහා රු.2,010,525 ක ආයෝජන පොළී ආදායමක් ලබා ගෙන තිබුණද, ප්‍රතිපාදන වලින් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි. | 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලසුමට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කොට සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් කළමණාකරන තොරතුරු පද්ධතිය සැකසීමට මෘදුකාංග සැපයුම් ආයතනයක් තෝරාගෙන ඔවුන්ගේ සහයෝගයෙන් එහි මූලික කටයුතු සිදු කොට තිබු අතර, එහි පලමු සැපයුම් කට්ටලයට රු. 1,009,250.00 ගෙවා එම ආයතනය සමඟ තිබූ ගිවිසුම අවසන් කර ඇත. ඉන්පසු නැවත මෘදුකාංග සැපයුම් ආයතනයක් තෝරාගැනීම සඳහා 2023-09-18 දින නව ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ආරම්භ කර ඇත. එම ප්‍රසම්පාදන ක්‍රියාවලියේ තෝරාගැනීමට යෝජිත සමාගම විසින් ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදනය නිර්මාණය කිරීම සඳහා වන වියදම, නඩත්තු වියදම සහ සර්වර් වියදම අධික බවත් ප්‍රතිපාදන ඉක්මවා තිබුණු බවත් සහ වෙනත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝණය වී තිබුණු බවත් සඳහන් කරමින් ප්‍රසම්පාදන මණ්ඩලයට පත් නව සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලයේ උපදෙස් ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස 2025-02-06 වන දින පැවති 303 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. |

| යොමු අංකය | විගණකාධිපති වාර්තාවේ ඇතුලත් නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2.2.4 (ආ) | මණ්ඩලය විසින් 2017 වර්ෂයේදි ආරම්භ කර තිබුණු කලාකරුවන් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමය වෙනුවෙන් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය රු. මිලියන 94 ක මුදලක් ලබා දී තිබුණි. එම මුදල් බැංකු ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ ශේෂය රු. මිලියන 186.64 ක් දක්වා වර්ධනය කරගෙන තිබුණි. ඒ අනුව කලාකරුවන් වෙනුවෙන් ලැබුණු මුදල අදාල කාර්යය සඳහා නිසි පරිදි යෙදවීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි. | සමාජ ආරක්ෂණ මණ්ඩලය රජයේ විශ්‍රාම වැටුපක් නොමැති ස්වයං රැකියාලාභීන් සඳහා රාජ්‍ය විශ්‍රාම වැටුපක් ලබාදීම සිදුකරයි. ඒ යටතේ කලාකරුවන් සඳහා මෙම සේවාව ලබාදීමට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සමාජ ආරක්ෂණ මණ්ඩලය සමඟ 2017 දී අවබෝධතාවයකට එකඟ වී ඇත. ඒ අනුව අවබෝධතා ගිවිසුමේ 2 වගන්තිය අනුව කලාකරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ අරමුණ හා අපේක්ෂාවන් ඉටුකර ගැනීම වෙනුවෙන් කටයුතු කිරීම දෙපාර්ශවයේම කාර්යභාරය වේ. විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සාමාජික කරවිය යුතු තම කලාකරුවන් ගිවිසුමේ වගන්ති 2 (අ) අනුව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව විසින් තෝරා ඉදිරිපත් කළ යුතුවේ.<br>අවබෝධතා ගිවිසුමේ 2 (අ) වගන්තිය<br>"ප්‍රකාශිතවම ශ්‍රී ලාංකීය කලා ක්ෂේත්‍රය තුළ තම දායකත්වය ලබාදෙන්නා වූ කලාකරුවන් උදෙසා ස.ආ.ම. මගින් ක්‍රියාත්මක කරන "සුරැකුම"විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ ඊට අදාළ සියළු ප්‍රතිලාභ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් තෝරා ඉදිරිපත් කරන කලාකරුවන් වෙත හඳුන්වා දී ක්‍රියාත්මක කිරීමට දෙපාර්ශවය එකඟ වේ" ලෙස සඳහන් වේ.<br><br>එසේ වුවද, යෝජනා ක්‍රමය වඩාත් ආකර්ෂණීය කිරීම සඳහා,යෝජනාවලියක් සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති අතර මේ වන විට සමාජ ආරක්ෂණ මණ්ඩලයේ බඳවා ගැනීම් නිලධාරී ජාලය හරහා බඳවා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතී. |

| යොමු අංකය | විගණකාධිපති වාර්තාවේ ඇතුලත් නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2.2.4 (ඇ) | ඉකුත් වර්ෂ සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දී සාමාජිකයන් බඳවා ගැනීම අඩුමට්ටමක පැවැති අතර 1999 අංක 33 දරණ පනතින් සංශෝධිත 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩල පනත හා 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/05 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද රෙගුලාසි අංක 04 අනුව ව්‍යවස්ථාපිත ප්‍රධාන අරමුණ වන විශ්‍රාම වැටුප් හිමිකම ලබා නොසිටින හෝ විශ්‍රාම වැටුප් සහිත තනතුර නොදරන සියලු සේවා නියුක්තිකයන් වෙත සමාජ ආරක්ෂණ හා විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම. ඒ අනුව ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ට සලසා දීමට අපේක්ෂිත අරමුණු ඉටු නොකිරීම හේතුවෙන් පහත සඳහන් පරිදි කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩු ප්‍රමාණයක පැවතුණි. | |
| 2.2.4 (ඇ) (i) | සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විට විශ්‍රාම වැටුප් ක්‍රමයට නව දායකයින් බඳවා ගැනීමේදී අය කල පළමු වාරික මුදල් එකතුව රු.මිලියන 163.29 ක් වූ අතර වාර්ෂික රැස් කිරීම් රු.මිලියන 261.77 විය.සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ආදායම වූ රු.මිලියන 769.55 ක මුදල සාමාජිකයින්ගේ දායක මුදලින් හා ආයෝජන පොලී ආදායම් වලින් සමන්විත වූ අතර ප්‍රධාන ආදායම වන සාමාජිකයින්ගේ දායක මුදල් වලින් සමාලෝචිත වර්ෂය තුළදී සාමාජිකයන් 539 ක් විශ්‍රාම වැටුප හිමිවන දිනට පෙර හා විශ්‍රාම වැටුප හිමිවන දිනට පසු ඉවත්වීම හේතුවෙන් රු.මිලියන 22.12ක් ආපසු ගෙවා තිබුණි. | පනත ප්‍රකාරව ගෙවීම් කිරීමට සිදුවේ. |
| 2.2.4 (ඇ) (ii) | කාර්ය සාධන වාර්තාව අනුව 2024 දෙසැම්බර් 31 දක්වා විශ්‍රාම වැටුප් ක්‍රමයට දායකයින් 55,964 ක් බඳවාගෙන තිබුණද ඔප්පු නිකුත් කර තිබුණේ දායකයින් 25,510 පමණි.එනම් සියයට 46 කට පමණි. | සාමාජිකත්වයට අදාල දායක අයදුම්පත ඉදිරිපත් කළ පසු එය පරීක්ෂා කර ඔප්පුව, එයට අදාල අත්පොත සහ පාස් පොත් නිකුත් කිරීම සඳහා සාමාන්‍යයෙන් මාස03ක පමණ කාලයක් ගතවන බව තීරණය කර ඇත. එබැවින් සාමාජිකයා යෝජනා ක්‍රමයට බඳවා ගැනීමේ දී නිකුත් කරන කුවිතාන්සිපතෙහි ඔප්පු නිකුත් කරන තෙක් මෙය තාවකාලික ඔප්පුවක් සේ සලකන බව සඳහන් කර ඇත. කෙසේ වුවද, ඇතැම් අවස්ථාවල ඔප්පු නිකුත් කිරීම දින 02ක්, සතියක් වැනි කාලයක් තුළ සිදු කරන අවස්ථා ද ඇත. 2024 වර්ෂයෙ බඳවා ගත් සාමාජිකයන් 56,964න් 22,430 |

| යොමු අංකය | විගණකාධිපති වාර්තාවේ ඇතුලත් නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම |
|---|---|---|
| | | දෙනෙකු බඳවාගෙන ඇත්තේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවල වන අතර, ඒ සියලුදෙනා සඳහා ඔප්පු නිකුත් කිරීම 2025 අප්‍රේල් වන විට සම්පූර්ණ කර ඇත.<br>කෙසේ වුව ද, ඉදිරියේදී තොරතුරු තාක්ෂණය උපයෝගී කර ගනිමින් ඔප්පු නිකුත් කිරීම කඩිනම් කිරීමට සැලසුම් සකස් කර ඇත. |
| 2.2.4 (iii) | වෘත්තීය පුහුණු ආයතනවල හා තරුණ කණ්ඩායම් වල සිසුන් 400 ක් සඳහා රු.200,000 ක් වැය කර ස්වයං රැකියා / ව්‍යවසායකත්ව හැකියාවන් වැඩිදියුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම අපේක්ෂා කළ ද සිසුන් 298 ක් සඳහා පමණක් වැඩසටහන් පවත්වා තිබුණි. | වැඩසටහන් 04ක් සැලසුම් කර ඇති අතර, ඒ වැඩසටහන් 04ම සාර්ථකව අවසන් කරන ලදී.එක් වැඩසටහනක් සඳහා සිසුන් 100 බැගින් වැඩසටහන් 04 සඳහා සිසුන් 400ක් සහභාගී වෙතැයි අපේක්ෂා කළ ද, සමස්ථ වැඩසටහන සඳහා සහභාගී වූයේ සිසුන් 298කි. (එනම් 74.5%කි.)<br>රු.200,000ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද සහභාගීත්වය අඩුවීමත්, ඇතැම් වියදම් අඩුකර ගැනීමටත් හැකිවීමත් නිසා රු.72,514ක මුදලකින් මෙම වැඩසටහන් සිදු කළ හැකි විය. |
| 2.2.4 (iv) | අක්‍රීය සාමාජිකයන් නැවත සක්‍රීය කිරීමේ ව්‍යාපෘතිය මගින් ස්වයං රැකියාවල නියුතු තැනැත්තන්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන ක්‍රියාකාරකම් 05ක් යටතේ සාමාජිකයන් 2000ක් සක්‍රීය කර රු. මිලියන 10ක් රැස්කිරීමට සැලසුම් කළද සාමාජිකයන් 316ක් පමණක් සක්‍රිය කර තිබුණු අතර රැස්කළ මුදල රු. මිලියන 5.47ක් විය. | අක්‍රීය සාමාජිකයන් නැවත සක්‍රීය කිරීමේ වැඩසටහනක් ද, පසු වාරික රැස්කිරීමේ වැඩසටහනක් ද ක්‍රියාත්මක විය. එලෙස වැඩසටහන් 02ක් ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රායෝගිකව මතු වූ ගැටළු නිසා, ඉහත සඳහන් අක්‍රීය සාමාජිකයන් නැවත සක්‍රීය කිරීමේ වැඩසටහන ද පසු වාරික රැස්කිරීමේ වැඩසටහන් තුළට ඇතුලත් කිරීමට කටයුතු කර ඇත. |
| 2.2.4 (v) | පෙර වර්ෂ ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.මිලියන 17.03 ක් වැය කර නව විශ්‍රාම වැටුප් තොරතුරු කළමනාකරණ පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමට සැලසුම් කලද සැපයුම්කරුවකු තෝරා ගැනීම හා ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කිරීම පමණක් සිදුකර තිබුණි. | පරිගණක තොරතුරු පද්ධතිය ස්ථාපනය කිරීම සඳයා තෝරාගත් සැපයුම්කරුව අනුමැතිය ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළ පසු, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හිමි වී නොමැති අතර, තැපැල් දෙපාර්තුමේන්තුව මඟින් එම පද්ධතිය ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත. |

| යොමු අංකය | විගණකාධිපති වාර්තාවේ ඇතුලත් නිරීක්ෂණ | කළමණාකරණයේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2.2.4 (ඈ) | සේවක ණය ශේෂයෙහි ඇතුළත් ආපදා ණය II යටතේ රු.88,999 ක ශේෂය 2000 වර්ෂයේ සිට පැවත එන අතර වසර 16 ක් ගත වී තිබුණද අය කර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු නොකර දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. 2022 වර්ෂයේදී නිලධාරියෙකු වෙත ලබා දී තිබු ණය රු.130,561 ක් හා පොලී ලෙස රු.14,623 කින් 2024 වර්ෂයේ කිසිදු වාරික මුදලක් අයකර නොතිබුණි. | ආපදා ණය II යටතේ 2008 වර්ෂයේ ලබාදී ඇති ණය මුදල 2024 පෙබරවාරි සිට රු. 1625.00 වාරිකය බැගින් 2025 මැයි දක්වා වාරික 15කින් අයකරගෙන ඇත. එය තවදුරටත් ගෙවීම් අවසානය දක්වා අය කිරීමට නියමිතය. |
| **2.3** | **වෙනත් කරුණු** | |
| 2.3 (අ) | නිලධාරීන් දීර්ඝකාලීනව ස්ථාන මාරු ඉල්ලීම් නොකිරීම, කළමනාකරණය විසින් ස්ථාන මාරු කිරීමට කටයුතු නොකිරීම, මණ්ඩලයේ අභ්‍යන්තර මාරු කිරීම් හා රාජකාරී විෂයයන් මාරු කළ හැකි නිලධාරීන්, දීර්ඝකාලීනව එක් රාජකාරී විෂයයක් ඉටු කිරීම වැනි කරුණු හේතුවෙන් නිලධාරියකු ස්ථාන මාරු කිරීමෙන් සපුරා ගැනීමට බලාපොරොත්තු වන නිලධාරියාගේ වෘත්තීය සංවර්ධනය, දක්ෂතා ප්‍රවර්ධනය, අත්දැකීම් ලබා ගැනීම, ආයතනයේ කාර්යක්ෂමතාව හා ඵලදායිතාව වර්ධනය කිරීම ඇතුළු අරමුණු දෙපාර්තමේන්තුවට ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි. | මාරු මණ්ඩලය මගින් අයදුම්පත් කැඳවා කාර්යමණ්ඩලයේ ස්ථාන මාරු කිරීම් සිදු කරනු ලැබේ. ඇතැම් අවස්ථාවලදී නිලධාරී හිඟය සහ එක් එක් ක්ෂේත්‍රය සඳහා අවශ්‍ය විශේෂ දැනුම හේතුවෙන් වසර 04ක සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන්ගේ ඉල්ලීම් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ අවස්ථාද පවතී.කෙසේ වුව ද, මණ්ඩලයේ ප්‍රායෝගික තත්වයන් සලකා බලමින් ස්ථාන මාරු කිරීම් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. |
| 2.3 (ආ) | මණ්ඩලයේ අනුමත කාර්ය මණ්ඩලය 198 හා තත්ත්ව කාර්ය මණ්ඩලය 151 ක් වූ අතර තනතුරු 09 ක පුරප්පාඩු 47 ක් පැවතුණි. තනතුරු 03 ක් සඳහා නිලධාරීන් 09 දෙනෙකුට වැඩ බැලීමේ රාජකාරි පත්වීම් ලබා දී තිබුණි. | පුරප්පාඩු පිරවීමට අනුමැතිය ඉල්ලා තිබුණ ද අනුමැතිය නොලැබිණි. එබැවින් රාජකාරි ඉටු කිරීමේ පදනම මත පත් කර ගත් නිලධාරීන් සහ අනුයුක්ත කළ සංවර්ධන නිලධාරීන් මගින් අවශ්‍ය අවම රාජකාරි කටයුතු ඉටු කර ගැනීමට කටයුතු කරමින් පවතී. |

.................................................

කේ.ඒ.එස්. ප්‍රසන්න කළුආරච්චි

සාමාන්‍යාධිකාරී

SRI LANKA SOCIAL SECURITY BOARD
STATEMENT OF FINANCIAL POSITION
AS AT 31 ST DECEMBER 2024

| | NOTE | 2024 Rs | 2023 Rs |
|---|---|---|---|
| ASSETS | | | |
| CURRENT ASSETS | | | |
| CASH IN HAND AND BANK | 9 | 74,498,741 | 66,268,525 |
| DEPOSITS | 10 | 201,000 | 201,000 |
| ADVANCES | 11 | 19,300 | 96,800 |
| STAFF LOAN | 12 | 11,790,242 | 9,203,900 |
| OTHER ASSETS | 13 | 188,831,905 | 129,542,587 |
| CAPITAL WORKS IN PROGRESS | 14 | 1,275,250 | 1,090,250 |
| INVESTMENT | 15 | 3,352,218,953 | 3,203,988,258 |
| TOTAL CURRENT ASSETS | | 3,628,835,390 | 3,410,391,320 |
| NON CURRENT ASSETS | | | |
| PROPERTY, PLANT & EQUIPMENT | 16 | 216,464,561 | 185,433,235 |
| TOTAL NON CURRENT ASSETS | | 216,464,561 | 185,433,235 |
| TOTAL ASSETS | | 3,845,299,951 | 3,595,824,555 |
| LESS: | | | |
| LIABILITIES | | | |
| CURRENT LIABILITIES | | | |
| BANK OVERDRAFTS | | | |
| OTHER LIABILITIES | 17 | 175,312,683 | 146,797,925 |
| TOTAL CURRENT LIABILITIES | | 175,312,683 | 146,797,925 |
| NET CURRENT ASSETS | | 3,453,522,708 | 3,263,593,395 |
| NON CURRENT LIABILITIES | 18 | 47,714,388 | 38,486,215 |
| TOTAL LIABILITIES | | 223,027,070 | 185,284,140 |
| TOTAL NET ASSETS | | 3,622,272,881 | 3,410,540,415 |
| FINANCED BY | | | |
| ACCUMILATED FUND | 19 | (42,417,926) | (28,356,101) |
| REVALUATION RESERVE | 20 | 49,743,399 | 24,154,371 |
| S.L. SOCIAL SECURITY PENSION FUND | 21 | 3,422,245,496 | 3,222,087,642 |
| ELDERS FUND ACCOUNT | 22 | 1,286,004 | 1,238,594 |
| GOVERNMENT GRANTS & FUND | 23 | 191,415,908 | 191,415,908 |
| | | 3,622,272,881 | 3,410,540,415 |

"The Accounting policies on pages 1 to 5 and notes on pages 10-17 form an integral part of these Financial Statements.The Board of Directors is responsible for the preparation and presentation of these Financial Statements.

K.B.G.H.N.Kariyawasam
Deputy General Manager (Finance)

K.B.G.H.N.Kariyawasam
Deputy General Manager (Finance)
Sri Lanka Social Security Board
No 18, Rajagiriya Road,
Rajagiriya.

K.A.S.P.Kaluarachchi
General Manager

K.A.S.P. Kaluarachchi
General Manager

M.K.B.Dissanayaka
CEO

These Financial Statements were approved by the Board of Directors and signed on their behalf."

W.R.Gamage
Director

M.K.B.Dissanayaka
Chairman

Director
Sri Lanka Social Security Board

M.K.B. Dissanayake
Chairman
Sri Lanka Social Security Board
No:18, Rajagiriya Road, Rajagiriya.

Final Accounts 2024
Sri Lanka Social Security Board

**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය**
**මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය**
**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා**

| | සටහන | 2024 (රු.) | 2023(රු.) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | | | |
| අතැති මුදල් සහ බැංකු මුදල් | 9 | 74,498,741 | 66,268,525 |
| තැන්පතු | 10 | 201,000 | 201,000 |
| අත්තිකාරම් | 11 | 19,300 | 96,800 |
| කාර්ය මණ්ඩල ණය | 12 | 11,790,242 | 9,203,900 |
| වෙනත් වත්කම් | 13 | 188,831,905 | 129,542,587 |
| සිදුවෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු | 14 | 1,275,520 | 1,090,250 |
| ආයෝජන | 15 | 3,352,218,953 | 3,203,988,258 |
| | | | |
| **මුළු ජංගම වත්කම්** | | **3,628,835,390** | **3,410,391,320** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල,පිරියත සහ උපකරණ | 16 | 216,464,561 | 185,433,235 |
| | | | |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **216,464,561** | **185,433,235** |
| | | | |
| **මුළු වත්කම්** | | **3,845,299,951** | **3,595,824,555** |
| අඩුකලා : | | | |
| වගකීම් | | | |
| ජංගම වගකීම් | | | |
| බැංකු අයිරා | | | |
| වෙනත් වගකීම් | 17 | 175,312,683 | 146,797,925 |
| **මුළු ජංගම වගකීම්** | | **175,312,683** | **146,797,925** |
| | | | |
| **ජංගම නොවන වත්කම්** | | 3,453,522,708 | 3,263,593,395 |
| | | | |
| **ජංගම නොවන වගකීම්** | 18 | 47,714,388 | 38,486,215 |
| | | | |
| **මුළු වගකීම්** | | 223,027,070 | 185,284,140 |
| **මුළු ශුද්ධ වත්කම්** | | **3,622,272,881** | **3,410,540,415** |
| **මූල්‍ය සම්පාදනය කරනුයේ** | | | |
| සමුච්චිත අරමුදල | 19 | (42,417,926) | (28,356,101) |
| ප්‍රත්‍යාගණන සංචිත | 20 | 49,743,399 | 24,154,371 |
| ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් අරමුදල | 21 | 3,422,245,496 | 3,222,087,642 |
| වැඩිහිටි අරමුදල් ගිණුම | 22 | 1,286,004 | 1,238,594 |
| රාජ්‍ය සහ අරමුදල් ප්‍රදාන | 23 | 191,415,908 | 191,415,908 |
| | | **3,622,272,881** | **3,410,540,415** |

"පිටු අංක 1 සිට 5 දක්වා දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති සහ පිටු අංක 10 සිට 17 දක්වා දක්වා ඇති සටහන් තුළින් මෙම මූල්‍ය ප්‍රකාශන වල අත්‍යවශ්‍ය කොටසක් සකස් කරනු ලැබේ. එසේම මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතු වේ.

---------------------------------- ------------------------------------------- ---------------------------------

| | | |
|---|---|---|
